වාර්ෂික වාර්තාව 2019

# ප්‍රජවයෙන් ඉදිරියට



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு வலு அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority

# පෙළගැස්ම


## අප ගැන

සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිළිබඳව / **02**
මෙහෙවර/දැක්ම / **03**
ආයතනික සන්ධිස්ථාන / **04**
සභාපතිතුමාගේ පණිවුඩය / **06**
අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය / **09**
කළමනාකරණ මණ්ඩලය / **12**
විගණන හා කළමනාකරණ කමිටුව / **13**

## වසරේ කැපී පෙනෙන අවස්ථා

කාර්යසාධනයට අදාළ වැදගත් කරුණු / **16**
සුනිත්‍ය බලශක්ති ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්ති තුළින් ලඟාකරගත් ජයග්‍රහණ / **17**

## ආයතනික පාලනය

ආයතනික පාලනය / **20**
අවදානම් කළමනාකරණය / **21**

## කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම් / **24**
ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාකාරකම් / **32**
ජාත්‍යන්තර මූල්‍ය ආයතන අරමුදල් සම්බන්ධ ව්‍යාපෘති / **36**
මානව සම්පත් සංවර්ධනය / **40**
ක්‍රියාකාරී සැලැස්ම 2020 / **42**

## මූල්‍ය ප්‍රකාශන

ආදායම් ප්‍රකාශනය / **46**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය / **47**
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය / **48**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය / **49**
මූල්‍ය ප්‍රකාශනවලට සටහන් / **50**
ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව / **69**
2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර / **80**


පිවිසෙන්න
**www.energy.gov.lk**

අපගේ ජීවිතයේ සෑම පැතිකඩකටම අවශ්‍ය තිරසාරභාවයට ප්‍රමුඛත්වය දෙමින්, පෙර කවරදාකටත් වැඩියෙන් අවධානය යොමුවූ කාර්යය වනුයේ තිරසාර බලශක්ති නිෂ්පාදනයට අධිකාරියේ නායකත්වය දීමයි. 2019 වර්ෂය වැදගත් එකක් වේ. එය අවසානය නොවේ, මක්නිසාද යත් 2050 වන විට කාබන් භාවිතයෙන් තොර රටක් බිහි කිරීම අපගේ මෙහෙවර වන නිසාවෙනි. සිදුකලයුතු බොහෝ කාර්යභාරයන් ඔස්සේ අප ජවයෙන් ඉදිරියටම යාමට පොරොන්දු වන්නෙමු.

# ජවයෙන් ඉදිරියට

# සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිළිබඳව

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින්, 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම මගින් 2007 ඔක්තෝබර් 1 වන දින ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති විප්ලවය සඳහා නායකත්වය ලබා දීම සම්බන්ධව එහි පාලක මණ්ඩලය වගකීම දරයි. ශ්‍රී ලංකාව පුරා බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකි ප්‍රධාන ආයතනයක් ලෙස කටයුතු කිරීම, ඵලදායී, කාර්යක්ෂම හා පරිසර හිතකාමී ලෙස බලශක්ති අවශ්‍යතා සපුරාලීමට පහසුකම් සැපයීම, තිරසාර බලශක්ති සම්පත් කල්තියා හඳුනා ගැනීම ආයතනයේ අරමුණු වේ. ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනයේ එවැනි තීරණාත්මක කාර්යභාරයක් සම්බන්ධ ආයතනයක් ලෙස, අපගේ ඉලක්කය වන්නේ සූර්ය, සුළං, ජල හා ජෛව ස්කන්ධ ඇතුළු අප රටෙහි පොහොසත් බලශක්ති සම්පත් අඛණ්ඩව සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීමයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් බලශක්ති ක්ෂේත්‍රයේ උපායමාර්ගික ආයෝජන මෙහෙයවීමට උත්සාහ කරන අතර, එමඟින් අනාගතයේ දී පිරිසිදු, තිරසාර හා දේශීය වශයෙන් සපුරාගත හැකි බලශක්ති විසඳුම් වෙත මාරුවීමට ශ්‍රී ලංකාවට මග පෑදෙනු ඇත. අපගේ බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින්, තිරසාර බලශක්තිය සඳහා ජාතියේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා නව්‍ය බලශක්ති විසඳුම් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට අපට හැකි වන පරිදි පර්යේෂණ හා සංවර්ධන සහ දැනුම හුවමාරුව සඳහා පහසුකම් සැලසීමට අපි උත්සාහ කරමු.



# සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිළිබඳව

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ තිරසාර බලශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පුළුල් පරාසයක කාර්යභාරය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට පැවරී ඇත. මෙම පුළුල් විෂය පථය යටතේ මූලික අභිමතාර්ථයන් හතරක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ පහත පරිදි නියම කර ඇත.

(අ) පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය: බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නැංවීමේ අරමුණින් පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා සංවර්ධනය කිරීම සහ එමඟින් රටට ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ලබා ගැනීම.

(ආ) බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය: ගෘහස්ථ, වාණිජ, කෘෂිකාර්මික, ප්‍රවාහන, කාර්මික සහ වෙනත් අදාළ අංශවල බලශක්ති භාවිතය සඳහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම.

(ඇ) බලශක්ති ප්‍රතිපත්ති සංවර්ධනය හා තොරතුරු කළමනාකරණය: ප්‍රතිපත්ති සංවර්ධනය හා විශ්ලේෂණය සහ අදාළ තොරතුරු කළමනාකරණය මගින් රටට බලශක්ති බෙදා හැරීමේ ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ පිරිවැය ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.

(ඉ) අරමුදල් කළමනාකරණය: අවම ආර්ථික පිරිවැය හා බලශක්ති සුරක්ෂිතතාවයට අනුකූලව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ළඟා කර ගැනීම සඳහා කටයුතු කිරීම.



## දැක්ම

# බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

## මෙහෙවර

### ගවේෂණය, පහසුකම් සැපයීම, පර්යේෂණ සහ සංවර්ධන මෙන්ම දැනුම කළමනාකරණය තුළින් දේශීය බලශක්ති ප්‍රභව සංවර්ධනයට සහ බලශක්ති සම්පත් ඉතිරි කරගැනීමට සිදු කෙරෙන්නා වූ ජාතික ව්‍යායාමයට මඟ පෙන්වීම සහ එමගින් ස්වාභාවික, මානව සහ ආර්ථික සම්පත් සුරකිමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට මඟ සැලසීම

# ආයතනික සන්ධිස්ථාන

## 2014

- ශ්‍රී ලංකා සූර්ය සම්පත් සිතියම ප්‍රකාශයට පත් කිරීම

## 2007

- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවීම
- සුනිත්‍ය බලශක්තිය 6-11 ශ්‍රේණි සඳහා විෂය ඒකකයක් ලෙස විද්‍යා විෂය මාලාවට හඳුන්වා දෙන ලදී.



**01** තිරසාරත්වය කෙරෙහි යොමු වූ ප්‍රතිපත්ති සම්පාදනය

**02** පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීම

## 2010

- විදුල්කා ප්‍රදර්ශනය, බලශක්ති සම්මන්ත්‍රණය සහ ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මානය දියත් කිරීම
- අනිවාර්ය බලශක්ති ලේබල්කරණයට ලක් කළ පළමු නිෂ්පාදනය - සංයුක්ත ප්‍රතිදීප්ත පහන
- වහළ මත සූර්ය බලශක්ති උත්පාදනය උදෙසා නෙට්-මීටරින් (ශුද්ධ මනුකරණ) ක්‍රමය හඳුන්වා දීම

## 2011

- පාසල් බලශක්ති සමාජ හඳුන්වා දීම
- ජාතික බලශක්ති ජාලයට සම්බන්ධ කරන ලද මෙගාවොට් 1.237 ක ධාරිතාවකින් යුතු පළමු සූර්ය බලාගාරය හම්බන්තොට ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීම

# ආයතනික සන්ධිස්ථාන

## 2015

- ප්‍රතිපත්තිගත ඉලක්කය සාක්ෂාත් කරගනිමින්, විදුලිබල ජනනයෙන් 10% ක් නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර මගින් ලබා ගැනීම

## 2016

- නෙට්-මීටර් (ශුද්ධ මනුකරණ) ක්‍රමය වැඩිදියුණු කරමින් වහළ මත සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම ඉලක්ක කරගත් සූර්ය බල සංග්‍රාමය වැඩසටහන දියත් කිරීම

## 2018

- සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ වහළ මත සවිකළ සූර්ය බලශක්ති උත්පාදන පද්ධති සඳහා වූ 100 MW ඉලක්කය සපුරාලීම.
- UNDP/FAO/GEF හි අතිශයින්ම සාර්ථක ඇගයීම ලද තිරසාර ජෛවස්කන්ධ බලශක්ති ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම



**03** බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

**04** මහජනතාව සවිබලගැන්වීම

## 2017

- දස වැදෑරුම් වැඩසටහන් සමගින් බලශක්ති ඉල්ලුම් කළමනාකරණ පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකාය පිහිටුවීම

## 2019

- ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ගැසට් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති නිවාස සඳහා මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කිරීම
- UNDP / FAO / GEF යටතේ සම්පූර්ණ කරන ලද බලශක්ති NAMA ව්‍යාපෘතිය

# සභාපතිතුමාගේ පණිවුඩය



"

**අපගේ ක්‍රියාකාරකම්වල වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර ක්‍රියාවලීන් මාලාවක් සකස් කර පවත්නා ක්‍රියාවලීන් ප්‍රතිව්‍යුහගත කරන ලදී. අපගේ අවධානය යොමු වූයේ ආයෝජකයින්ට ඔවුන්ගේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අයදුම් කිරීම, ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මනා ලෙස පිළිගන්නා ආයතනයක් ගොඩනැගීමයි.**

# සභාපතිතුමාගේ පණිවුඩය

## බලශක්තියෙන් ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවක් උදෙසා

2019 වර්ෂයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති ධූරය හිමි වූ මා හට, එතෙක් පැවති ව්‍යාපෘති සම්මත කරගැනීම සහ ව්‍යාපෘති කළමනාකරණයෙන් ඉදිරියට ගොස් ප්‍රායෝගික මෙන්ම නවීන සහභාගිත්වයෙන් යුක්ත පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනයක් ඇති කිරීමට හැකියාව ලැබුනි. එහිදී අපගේ මූලික අභිප්‍රායන් වූයේ දිවයිනේ පවතින සියලුම පුනර්ජනනීය බලශක්ති ප්‍රභව හඳුනාගැනීම හා දිවයිනේ පවතින සියලු ශක්ති අර්බුදයන්ට පිළිතුරක් සෙවීම මෙන්ම විදේශ ආයෝජකයන්ගේ ආකර්ශනය දිනාගැනීමත්ය.

ශ්‍රී ලංකාව, වර්ෂ 2016 දී "පැරිස් ගිවිසුම" අත්සන් තැබීමත් සමග ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් ඇතිකිරීමේ වගකීම සහ පොරොන්දුව ඉටු කිරීමට කටයුතු යොදා ඇත. මෙම අරමුණු ඉටුකර ගැනීමේ අවශ්‍යතාවය මත එයට නිසි අයුරින් මග පෙන්වීම මාගේ නායකත්වයෙන් යුක්ත කළමනාකරණ මණ්ඩලයේ කාර්යභාරය විය. එමෙන්ම මූලික නියාමන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පූර්ණ මාර්ගෝපදේශක ක්‍රියාවට නංවා ඇත. එහි පළමු ව්‍යාපෘතිය ලෙස මොණරාගල, සියඹලාණ්ඩුව, මෙගාවොට් 100ක ධාරිතාවකින් යුත් "සූර්ය බල උද්‍යානය" සහ මෙගාවොට් 180 ක ධාරිතාවකින් ඉදිකිරීමට නියමිත පුනරීන් අර්ධද්වීපයේ සුළං සහ සූර්ය බලශක්ති උද්‍යානය මූලික වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

## අභියෝගයන් උදෙසා නොසැලී ඉදිරියටම

මෙම වර්ෂයේදී, ශ්‍රී ලංකාව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පවතින අභියෝග සහ බාධක හමුවේ සාර්ථකව නැගීසිටීමට කටයුතු කළෙමු. එහිදී ප්‍රධාන අභියෝග වශයෙන් නෛතික ගැටළු පෙන්වා දිය හැකි අතර රාජ්‍ය පාර්ශවකරුවන් වන මහජන උපයෝගීතා කොමිසම, ලංකා විදුලිබල මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව යනාදිය කටයුතු කළේය.

අනෙකුත් ක්‍රියාකාරකම් වලදී, මොරටුව, පේරාදෙණිය, කොළඹ සහ යාපනය විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන්ගේ සහයෝගය SLSEA හි උපදේශක කමිටුවට ලබා ගැනීමට අපට හැකි වූ අතර, ඔවුන්ගේ විශේෂඥ දැනුම උපයෝගී කරගෙන, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා ශක්‍ය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමට නිතිපතා රැස්වීම් සහ සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. මෙමගින් විස්තීර්ණ බලශක්ති සම්පත් සිතියම්ගත කිරීමට ද ඒවා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මගින් ගැසට් කිරීමටද SLSEA වෙත නීතිමය ඉඩ ප්‍රස්ථාව සැලසුනි.

තවද, අප හට මෙතෙක් සිහිනයක්ව පැවති පරිපාලන සහ මූල්‍ය ක්ෂේත්‍රයේ අඩාලවීම් වලට පිළිතුරු සෙවීමට හැකි විය. වාර්ෂික වාර්තා සහ විගණන කටයුතු වල පැවති කල්ගතවීම් ද, මෙමගින් නිරාකරණය කිරීමට හැකියාව ලැබුනි. පුනර්ජනනීය බලශක්ති අංශය මත පනවා ඇති ප්‍රතිපත්ති හා නියාමන අභියෝග රැසකට මුහුණ දීමටද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට සිදුවිය. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට අවම බාධා හා ප්‍රමාදයන් සමඟ කටයුතු කළ හැකි වන පරිදි අදාළ සියලු අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය මගින් මෙම බාධක හඳුනාගෙන විසඳීමට අපි බොහෝ මුල පිරීම් හා උත්සාහයන් ගෙන ඇත්තෙමු.

මෙම වර්ෂයේදී අපගේ මූලික අභිප්‍රාය වශයෙන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාවට නංවා ගැනීමේදී මූලික වශයෙන් ගැටලුවක් වූ ඉඩම් පවරා ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇති අතර තවත් මූලික අභියෝගයක් වන පුනර්ජනනීය බලශක්ති මත පනවා ඇති තීරුබදු ගැටළුවටද පිළිතුරු සෙවීමට පියවර ගෙන ඇත. එමෙන්ම 2030 වර්ෂය වන විට අපගේ ප්‍රධාන ඉලක්කය වන පුනර්ජනනීය බලශක්තිය මගින් රටෙහි බලශක්ති අර්බුදයන්ට පිළිතුරු සෙවීමට පියවර ගෙන ඇත.

## අවස්ථාවන් නිර්මාණය කිරීම

නාගරික කුටුම්භවල පියැසි සූර්ය බල පද්ධති ඇති කිරීමේ ව්‍යාපෘතිය සඳහා 8% ක අඩු පොලී අනුපාතිකයක් යටතේ පහසුකම් සැලසීම සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා දැනට පවතින ඌන උපයෝගීතා අවස්ථා ප්‍රයෝජනයට ගැනීම උදෙසා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක ණය යෝජනා ක්‍රමයක් සාර්ථකව ලබාගෙන නව අවස්ථා උත්පාදනය කිරීමට අවස්ථාව ලැබී ඇත.

මාගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, කොරියානු බලශක්ති අධිකාරිය හා සම්බන්ධව සාකච්ඡා හා අධ්‍යයන චාරිකා මගින්, සූර්ය බලශක්තිය බැටරිවල ගබඩා කිරීමේ තාක්ෂණ සංවර්ධනය පිළිබඳ විශේෂඥ දැනුම ලබා ගැනීමට මෙන්ම සූර්ය / බැටරි ආරෝපණ මධ්‍යස්ථාන මගින් බැටරි බලයෙන් ධාවනය වන වාහන ක්‍රියාත්මක කිරීමට ද හැකි විය. සූර්ය බැටරි බලයෙන් ක්‍රියාත්මක වන ත්‍රීරෝද රථ තුනක් සහ සූර්ය බල ආරෝපණ මධ්‍යස්ථානයක් සඳහා KEA විසින් ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඉහත ආරෝපණ මධ්‍යස්ථානය සහ ත්‍රීරෝද රථ, BMICH හි නිදර්ශක භාවිතයට ස්ථාපනය කරන ලදී.

## නව නිපැයුම් හඳුන්වාදීම

ගෘහස්ථ සූර්ය විදුලි පද්ධති මගින් ජනනය වන අතිරික්ත ශක්තිය ගබඩා කිරීම සඳහා බැටරිවල ශක්‍යතාවය අධ්‍යයනය කළෙමු. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවට උතුරින් පිහිටි හුදෙකලා ගම්මානවලට සහ දූපත් වලට සූර්ය බලශක්තිය හඳුන්වා දීමට ද අධ්‍යයන සිදු කරන ලද අතර, එමගින් ප්‍රධාන විදුලිබල පද්ධතියට සම්බන්ධ මිල අධික සම්ප්‍රේෂණ මාර්ග අවශ්‍ය නොවන විකල්ප විසඳුමක් ඉදිරිපත් කරයි.

සූර්ය බලශක්ති සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමේ මාධ්‍යයක් ලෙස ප්‍රධාන ජල විදුලි බලාගාරවල ජලාශවල පාවෙන සූර්ය පැනල ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගවේෂණය කිරීමට කටයුතු කෙරිණි. මෙම ප්‍රශස්තිකරණය වනුයේ දිවා කාලයේදී පාවෙන පැනල් වලින් සූර්ය බලශක්තිය භාවිතා කිරීම සහ එකම සම්ප්‍රේෂණ මාර්ග හරහා රාත්‍රියේදී ජල විදුලි උත්පාදනය භාවිතා කිරීමයි. නියඟ සමය සහ / හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉතිරි කර ගත හැකි ලෙස ජලාශවල අවම වශයෙන් තුනෙන් එකක් වත් ජලය සංරක්ෂණය කිරීමට මෙය උපකාරී වේ.

# සභාපතිතුමාගේ පණිවුඩය

පහළ ජලාශයේ සිට ඉහළ ජලාශය දක්වා විදුලි උත්පාදනයෙන් පසු ජලාශ නැවත පිරවීම සඳහා ප්‍රතිලෝම පොම්ප කිරීමේ තාක්ෂණය භාවිතා කරමින් ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘතිවල ජලය නැවත භාවිතා කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිලාභ පිළිබඳව ද අධ්‍යයන සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ දැනට භාවිතා නොකරන පහසුකමක් වන නිවාසවල සූර්යපැනල සහිත බැටරි භාවිතා කිරීම මගින් විදුලිබලය විසන්ධි වූ විට විදුලිය ලබා ගැනීම පිළිබඳව ද අවධානය යොමු කෙරිණි.

### වගවීම

අපගේ ක්‍රියාකාරකම්වල වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර ක්‍රියාවලීන් මාලාවක් සකස් කර පවත්නා ක්‍රියාවලීන් ප්‍රතිව්‍යුහගත කරන ලදී. අපගේ අවධානය යොමු වූයේ ආයෝජකයින්ට ඔවුන්ගේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අයදුම් කිරීම, ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මනා ලෙස පිළිගන්නා ආයතනයක් ගොඩනැගීමයි. නව ව්‍යාපෘති සඳහා අනුකූල වූත් විශේෂවූත් දිරිගැන්වීම් හඳුන්වාදීම තුළින් අප මෙය සාර්ථකව අත්කර ගෙන ඇති බව මා විසින් සතුටින් දන්වන්නෙමු. මෙය ඉතාමත් හොඳ විදේශීය ආයෝජනයකි.

වඩාත් නිශ්චිතව කිවහොත්, අනුමත කළ නමුත් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන සූර්ය ව්‍යාපෘති සඳහා අනාගතයේදී දඩුවම් ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවේ. විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම (PPA) සමඟ අවසන් අනුමත කිරීමේ අදියරේදී ජාලක සම්බන්ධතා පහසුකම වෙන් කිරීමේ පිරිවැයට සාපේක්ෂව ව්‍යාපෘති වටිනාකමෙන් 20% ක තැන්පතුවක් ලබා ගැනීමෙන් මෙය ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම තැන්පතුව වාරික දෙකකින් මුදා හරිනු ඇති අතර, පළමු වාරිකය තැන්පතුවෙන් 10% ක් වන අතර, ව්‍යාපෘතිය 50% ක් සම්පූර්ණ වූ විට මුදා හරිනු ඇත. ව්‍යාපෘතිය අවසන් වූ පසු ඉතිරි තැන්පතුව නිදහස් කරනු ලැබේ. මෙම නව මාර්ගෝපදේශය මගින් ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අව්‍යාජ ආයෝජකයින් දිරිමත් කරනු ඇත. මෙම නව මාර්ගෝපදේශය මඟින් ව්‍යාපෘති සඳහා ඉල්ලුම් කරන ආයෝජකයින්ට වැඩ නිම කිරීම සඳහා කාල රාමුවක් ලබා දිය යුතු බව ද සඳහන් කරයි. යෝජිත කාල සීමාව තුළ ව්‍යාපෘති සම්පූර්ණ නොකරන අයට ඔවුන්ගේ තැන්පතුව අහිමි වන අතර ඔවුන්ගේ ජාල සම්බන්ධතා පහසුකම අහිමි වේ. මේ වන විට මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.

### අනාගත දැක්ම

අපගේ මධ්‍යම හා දිගු කාලීන ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාව විසින් අනුමත කර ඇති පැරිස් සම්මුති ඉලක්ක සපුරා ගැනීම, 2030 වන විට අවම වශයෙන් 30-35% නව පුනර්ජනනීය බලශක්තියක්ද, 2050 වන විට 50% ක් ද සංවර්ධනය කිරීමත්ය. ශ්‍රී ලංකාව මේ ඉලක්කයට අනුගතව සිටින්නේ 23% ක් පමණ පුනර්ජනනීය බලශක්තියක් මධ්‍ය කාලීනව අත්කර ගැනීමටය. නව සුළං, සූර්ය හා ජෛව ස්කන්ධ ව්‍යාපෘති ගවේෂණය කිරීමත් සමඟ පැරිස් සම්මුතියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට නැවත නිවැරදි ගමන් මාර්ගයට යාමට හැකිවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ගෝලීය ප්‍රවණතා ද ආශීර්වාදයක් වී ඇති අතර වැඩි පදිංචිකරුවන් ප්‍රමාණයක් සිය ගෘහස්ථ භාවිතය සඳහා සූර්ය බලශක්තිය තෝරාගෙන ඇත. නාගරික වැසියන් සහ පාසල් හා පන්සල් වැනි ග්‍රාමීය පොදු ස්ථාන සූර්ය බැටරි තාක්ෂණය ඔවුන්ගේ බලශක්ති අවශ්‍යතාවයන් සඳහා යොදා ගැනීමට දිරිමත් කිරීමට අපට අවශ්‍ය වේ.

දේශීය පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය කිරීම ඉදිරි වසරවලදී ඉහළ නැංවීමට මා තුළ දැඩි උනන්දුවක් ඇත. කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය, ග්‍රාමීය කර්මාන්ත සහ දේශීය ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකිය.

### පැසසුම

අවසාන වශයෙන් ස්වයංපෝෂිත බලශක්ති සංවර්ධනයක් ඇති කිරීමට කටයුතු කරන සෑම පුද්ගලයකුටම මාගේ හෘදයාංගම ප්‍රශංසා සහ පැසසුම් ද, විශේෂයෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා හා අධ්‍යක්ෂකවරුන්හටද, කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්හටද, ඔවුන්ගේ නොපසුබට උත්සාහයටද මම ස්තුති කරමි.



**ටී.එම්.ආර්. බන්ගේස ජයා**
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය



"

2019 වන විට පියැසි සූර්ය පද්ධති සඳහා මෙගාවොට් 200 ක ඉලක්කයක් සපුරා ගැනීම හේතුවෙන් අධිකාරිය සතුටට පත්වේ. 2019 මැයි මාසය වන විට 2020 ඉලක්ක සපුරා ගැනීමට හැකිවීම විශාල ජයග්‍රහණයක් වූ අතර, ව්‍යාපෘති කඩිනම් කිරීමට අධිකාරිය ගත් උත්සාහයට ස්තුතිවන්ත වන්නෙමු. මෙය එළඹෙන වර්ෂය සඳහා අපගේ අනාගත පුනර්ජනනීය බලශක්ති ඉලක්ක වඩා හොඳින් පිහිටුවීමට උපකාරී වේ.

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

## ජයග්‍රහණ හා අවස්ථාවන්ගෙන් සමන්විත වසරක්

2019 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට තීරණාත්මක වසරක් වූ අතර පැරිස් සම්මුතියේ පොරොන්දු සපුරාලීමට අප සූදානම් වූ අතර අපගේ ජාතික පුනර්ජනනීය බලශක්ති අරමුණු සාක්ෂාත් කර ගැනීමේ වගකීම ද අප සතු විය.

මෙම වසරේ අධිකාරියට තිබූ එක් ප්‍රධාන අභියෝගයක් වූයේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා කැපවීමයි. එබැවින්, සියලු ව්‍යාපෘති හා වැඩසටහන් ඊට අනුගත විය යුතු විය. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරීන්ගේ අවධානය හා කැපවීම නිසා මෙම ඉලක්ක බොහොමයක් සපුරා ගැනීමේදී අධිකාරිය අපේක්ෂාවන්ට වඩා ඉහළින් සිටීම සතුටට කරුණකි.

## පුනර්ජනනීය බලශක්ති කාර්ය සාධනය

අපගේ ප්‍රධාන වගකීමක් ලෙස, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පුනර්ජනනීය බලශක්තිය තුළින් විදුලිබල උත්පාදන ධාරිතාව ඉහළ නැංවීමට ඉලක්ක පිහිටුවා ඇත. 2019 වන විට පියැසි සූර්ය පද්ධති සඳහා මෙගාවොට් 200 ක ඉලක්කයක් සපුරා ගැනීම හේතුවෙන් අධිකාරිය සතුටට පත්වේ. 2019 මැයි මාසය වන විට 2020 ඉලක්ක සපුරා ගැනීමට හැකිවීම විශාල ජයග්‍රහණයක් වූ අතර, ව්‍යාපෘති කඩිනම් කිරීමට අධිකාරිය ගත් උත්සාහයට ස්තුතිවන්ත වන්නෙමු. මෙය එළඹෙන වර්ෂය සඳහා අපගේ අනාගත පුනර්ජනනීය බලශක්ති ඉලක්ක වඩා හොඳින් පිහිටුවීමට උපකාරී වේ.

## බලශක්ති ප්‍රතිපත්තිය

2019 දී අධිකාරිය විසින් නියාමනයට සහාය වන සහ කර්මාන්ත අපේක්ෂාවන්ට සහාය වන ප්‍රතිපත්ති හා රෙගුලාසි පිළිබඳ ගැටළු විසඳීමට අප භාර ගන්නා ලදී. පැරිස් සම්මුතියේ පොදු අරමුණු කරා වන සියලු උත්සාහයන් සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිපත්ති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ අපි හඳුන්වා දුන්නෙමු. මෙම ප්‍රයත්නයේ දී 2019 අගෝස්තු මාසයේදී 'ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග' ගැසට් කිරීමටද අපට හැකි විය. තවද, 'බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි සංග්‍රහය' අවසන් කොට, 'තිරසර බලශක්ති නිවාස' අරමුණු කෙරෙන බලශක්ති කාර්යක්ෂම නිවාස සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීමට අපට හැකි විය. 'LED අවම කාර්ය සාධන ප්‍රමිතීන්, සිවිලිම් විදුලි පංකා සඳහා අනිවාර්ය බලශක්ති ලේබලිත වැඩසටහන, 'ශීතකරණ සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන', 'LED ලාම්පු සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන' සහ රූපවාහිනී, බත් පිසින උඳුන් සහ වතුර පොම්ප 'බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන' ආරම්භ කිරීමට අපට හැකි විය.

## තාක්ෂණ නැඹුරුව

SLSEA හි පද්ධති සහ ක්‍රියාවලීන් මාර්ගගත වේදිකාවක් බවට පරිවර්තනය කිරීමට අධිකාරිය තීරණයක් ගත් අතර මූල්‍ය කටයුතු සිදු කිරීම සඳහා පූර්ණ ඩිජිටල්කරණයට පරිවර්තනය වූ ක්‍රියාවලියක් සාර්ථකව නිම කළේය. මේ අනුව, කුඩා ජලවිදුලි බලාගාර සඳහා මාර්ගගත පුනර්ජනනීය බලශක්ති බලපත් අයදුම්පත් ලබාගැනීමේ ක්‍රියාවලිය සහ මාර්ගගතව සිදුවන පාරිසරික ප්‍රවාහ ක්‍රියාවලිය නියාමනය ආරම්භ කරන ලදී. මෙයින් පැහැදිලි වන්නේ SLSEA හි පද්ධති, ක්‍රියාවලීන්, අනුමැතීන් සහ ක්‍රියාකාරකම් සියල්ල වේගවත්ව, කාර්යක්ෂමව හා විනිවිදභාවයකින් යුක්තව සිදුවන බවයි.

## පර්යේෂණ සඳහා ආයෝජනය කිරීම

2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මහජනතාව සඳහා පුනර්ජනනීය බලශක්ති දත්ත සඳහා ප්‍රවේශය සහ බලාගැනීමට පහසුකම් සැපයීම උදෙසා පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිහිපයක් සඳහා ආයෝජනය කර ඇත.

UNDP හි සහාය ඇතිව අධිකාරිය බලශක්ති දත්ත කළමනාකරණ පද්ධතිය සඳහා වෙබ් අඩවියක් දියත් කළ අතර, ඒ හරහා දිවයින පුරා පුනර්ජනනීය බලශක්ති හා බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘති දත්ත මහජන දැනුම සඳහා ප්‍රකාශයට පත් කිරීමට හැකිවේ. කර්මාන්ත විශ්ලේෂකයින් සහ ගෝලීය බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධව උනන්දුවක් දක්වන අය සහ ආයෝජකයින් සඳහා හරිතාගාර වායු විමෝචනය (GHG) අඩු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ බලශක්ති උත්පාදනය පිළිබඳ දත්ත වෙබ් අඩවිය මගින් යාවත්කාලීන කරයි.

මුහුදු රළ බලශක්ති සම්පත් තක්සේරු කිරීම පිළිබඳ පර්යේෂණ අවසන් කරන ලද අතර, එය ජාතික විදුලිබල පද්ධතියට සැලකිය යුතු ධාරිතාවක් එක් කිරීමේ හැකියාවක් ඇතැයි අපි විශ්වාස කරමු. එහි විභවය තවම තක්සේරු කර නැතත්, එහි ප්‍රාථමික බලශක්ති ප්‍රමාණය වසරකට ටෙරාවොට් 50 කට ආසන්න විය හැකි යැයි අපි අපේක්ෂා කරමු.

ලෝක බැංකු ESMAP වැඩසටහන සමඟ සහයෝගයෙන් මුහුදාශ්‍රිත සුළං බලශක්තියේ ශක්‍යතාව ගවේෂණය කිරීමේ ව්‍යාපෘතියක් ද අපි ආරම්භ කර ඇත්තෙමු. උතුරු අර්ධද්වීපයේ මෙම මූලාශ්‍රය ගිගාවොට් 50 කට වඩා වැඩි ධාරිතාවක් ඇතැයි විශ්වාස කෙරේ.

මෙම ව්‍යාපෘති සියල්ලම එක්ව පැරිස් ප්‍රකාශනයේ බලශක්ති අවශ්‍යතා සපුරාලීමට මෙන්ම, ජාතික බලශක්ති ඉලක්ක සඳහා ද ප්‍රමාණවත් වේ.

# අධ්‍යක්‍ෂ ජනරාල්ගේ සමාලෝචනය

**සුරක්ෂිත පුනර්ජනනීය බලශක්තියෙන් සපිරි අනාගතයක් උදෙසා** අරමුදල් සපයන ආයතනවල සහ විදේශීය ආයෝජකයින්ගේ සහාය ඇතිව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පැරිස් සම්මුතියේ ඉලක්ක සපුරා ගනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරී සැලැස්මක් අධිකාරිය විසින් සකසා ඇති අතර සියලු අංශ හරහා පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නංවයි.

මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති උද්‍යාන සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන නව ක්‍රමවේද හඳුන්වාදී ඇත්තෙමු. තිරසාර ජෛව ස්කන්ධ බලශක්ති උත්පාදනය සහ නවීන ජෛව බලශක්ති තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමේ සාර්ථක ව්‍යාපෘතියක් ද අපි අවසන් කර ඇත්තෙමු.

මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වය සමඟ, තිරසාර බලශක්ති ඉලක්ක සපුරා ගැනීම උදෙසා වූ ශ්‍රී ලංකාවේ ගමන් මග සාක්ෂාත් කරගත හැකි යථාර්ථයක් බව අපි විශ්වාස කරන්නෙමු.



**ආචාර්ය අසංක රොද්‍රිගෝ**
අධ්‍යක්ෂ ජනරාල්

# කළමනාකරණ මණ්ඩලය

**ටී.එම්.ආර්. බන්ග්ස ජයා මහතා**
*සභාපති*
2019 ජනවාරි 30 - 2019 නොවැම්බර් 25

**කේ. එම්. මාලිනී කුමාරිහාමි මහත්මිය**
*අතිරේක ලේකම් (පරිපාලන හා ප්‍රසම්පාදන)*
විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය
ජනවාරි - සැප්තැම්බර්

**අයි. ජේ. අබේරත්න මහත්මිය**
*අධ්‍යක්ෂ (වානිජ සහ පර්යේෂණ හා සංවර්ධන)*
කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය
ජනවාරි - පෙබරවාරි

**දමින්ද කුමාර මහතා**
*ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන)*
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ජනවාරි - පෙබරවාරි

**කේ. ඩී. ගුරුගේ මහතා**
*ප්‍රධාන ගණකාධිකාරී*
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ජනවාරි - පෙබරවාරි

**ජී.ඩී.පී.කේ.සේනාරත්න මහතා**
*පත්කළ සාමාජික*
30.01.2019 - අගෝස්තු

**ඩී. වී. බන්දුලසේන මහතා**
*අතිරේක ලේකම්*
කෘෂිකර්ම අමාත්‍යාංශය
අගෝස්තු

**චින්තක උදයසාන්ත මහතා**
*පත්කළ සාමාජික*
2019 ඔක්තෝම්බර් 30 - දෙසැම්බර්

**ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ මහතා**
*ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්*
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

**එස්. තර්ශන් මහතා**
*සහකාර අධ්‍යක්ෂ*
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

**දමිත කුමාරසිංහ මහතා**
*අධ්‍යක්ෂ ජනරාල්*
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම

**ගුණරත්න වන්නිනායක මහතා**
*නීතිඥ*
පත්කළ සාමාජික
2019 ජනවාරි 30 - 2019 සැප්තැම්බර් 24

**එස්. උපුල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා**
*පත්කළ සාමාජික*
2018 ඔක්තෝම්බර් 30 - 2019 දෙසැම්බර් 17

**කිශාන් නානායක්කාර මහතා**
*පත්කළ සාමාජික*
2018 ඔක්තෝම්බර් 30 - 2019 දෙසැම්බර් 19

**අම්බපාලි සිකුරාජපති මිය**
*පත්කළ සාමාජික*
2019 ජනවාරි 30 - 2019 දෙසැම්බර් 17

**ඊ. එම්. පියසේන මහතා**
*පත්කළ සාමාජික*
2019 පෙබරවාරි 28

**ජේ. ඒ. රංජිත් මහතා**
*ලේකම්*
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2019 පෙබරවාරි 28 - 2019 දෙසැම්බර් 26

**කුලනි එච්. ඩබ්ලිව්. කරුණාරත්න**
*අධ්‍යක්ෂ (සමීක්ෂණ)*
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
2019 පෙබරවාරි 28 - 2019 දෙසැම්බර් 18

**ජී. එස්. කේ. කන්නන්ගර මහතා**
*ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන)*
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
2019 පෙබරවාරි 28 - 2019 දෙසැම්බර් 16

**එස්. එල්. නසීර් මහතා**
*අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සහ වාණිජ)*
කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය
2019 මාර්තු 12 - 2019 දෙසැම්බර් 16

**චින්තක එස් ලොකුහෙට්ටි මහතා**
*ලේකම්*
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
2018 ඔක්තෝම්බර් 30 - දෙසැම්බර්

**ඩබ්ලිව්.එම්. දීප්ති ප්‍රනාන්දු**
*අතිරේක ලේකම්*
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
2019 මැයි 14 - 2019 දෙසැම්බර් 17

**එම්. කේ. රාජපක්ෂ මහත්මිය**
*සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)*
විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය
2019 ඔක්තෝම්බර් 02 - 2019 දෙසැම්බර් 17

# විගණන හා කළමනාකරණ කමිටුව

2019 වර්ෂයට අදාල විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

**එස්. තර්ශන් මයා**
සභාපති

**මාලිනී කුමාරිහාමි මහත්මිය**
සාමාජික

**ගුණරත්න වන්නිනායක මහතා**
සාමාජික

**ඒ. එම්. ආර්. ජේ ජයසිංහ මහතා**
සාමාජික

**ඩබ්ලිව්. එම්. දීප්ති ප්‍රනාන්දු මහත්මිය**
සාමාජික

විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ නිළධාරීන්

**එච්. ඒ. ඩී. චාන්දනී මහත්මිය**
ජාතික විගණන කාර්යාලය

**ඊ. ඒ. එන්. පී එදිරිසිංහ මහත්මිය**
ජාතික විගණන කාර්යාලය

**බී. ඒ. ඩී. අබේවර්ධන මහත්මිය**
විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය

## ජල විදුලි

# 419.5 MW

## ව්‍යාපෘති සංඛ්‍යාව

# 208

පුනර්ජනනීය බලශක්ති උත්පාදනයේ ප්‍රධාන දායකත්වය අඛණ්ඩව සපයමින් දිවයිනේ ජාතික පුනර්ජනනීය බලශක්ති විදුලි ජනනයෙන් වැඩි ප්‍රමාණයක් දැනට පවතින ජල විදුලි බලාගාරවල ඇති නව පුනර්ජනනීය බලශක්ති කළඹ තුලින් සපයයි.



# වසරේ කැපී පෙනෙන අවස්ථා



# කාර්යසාධනයට අදාළ වැදගත් කරුණු

| විස්තරය | ඒකකය | 2019 | 2018 |
|---|---|---|---|
| **කාර්යසාධනයට අදාළ වැදගත් කරුණු** | | | |
| පුනර්ජනනීය විදුලිබල උත්පාදනය | GWh | 1,579 | 1,742 |
| කුඩා ජල විදුලිබල ව්‍යාපෘති වෙතින් සමුච්චිත ධාරිතාව | MW | 419 | 380 |
| සූර්ය බලශක්ති ව්‍යාපෘති (පොළොවට සවි කළ) වෙතින් සමුච්චිත ධාරිතාව | MW | 57 | 51 |
| සුළං බලශක්ති ව්‍යාපෘති වෙතින් සමුච්චිත ධාරිතාව | MW | 128 | 128 |
| ජෛවස්කන්ධ ව්‍යාපෘති වෙතින් සමුච්චිත ධාරිතාව | MW | 43 | 34 |
| ජාතික බලශක්ති ජාලයට සම්බන්ධිත වහළ මත සවිකළ සූර්ය බලශක්ති පද්ධතිවල සමුච්චිත සංඛ්‍යාව | සංඛ්‍යාව | 24,696 | 19,164 |
| වහළ මත සවිකළ සූර්ය බලශක්ති පද්ධති වෙතින් සමුච්චිත ධාරිතාව | MW | 261 | 176 |
| වහළ මත සවිකළ සූර්ය බලශක්ති ව්‍යාපෘති මගින් බලශක්ති උත්පාදනය | GWh | 362 | 215 |
| බලශක්ති කාර්යක්ෂම උපකරණ මගින් බලශක්ති ඉතිරිය | GWh | 738 | 721 |
| SLNEEA මැදහත්වීම් හරහා ඉතිරි කරගත් විදුලිබල ධාරිතාව | GWh | n/a | 27 |
| SLNEEA මැදහත්වීම් හරහා ඉතිරි කරගත් ෆොසිල ඉන්ධන ප්‍රමාණය | ලීටර මිලියන | n/a | 17 |
| වළක්වා ගන්නා ලද කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 2,090,338 | 2,193,563 |
| **මානව ප්‍රාග්ධනය** | | | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය | සංඛ්‍යාව | 104 | 100 |
| වසර 10 ට වැඩි සේවා කාලයක් සපුරා ඇති සේවකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 54 | 45 |
| වසර 5 ට වැඩි සේවා කාලයක් සපුරා ඇති සේවකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 77 | 71 |
| සේවකයන් සඳහා සිදු කර ඇති මුළු ගෙවීම් | රු. මිලියන | 92 | 94 |
| **සමාජ හා සබඳතා ප්‍රාග්ධනය** | | | |
| සිදු කරන ලද බලශක්ති විගණන සංඛ්‍යාව | සංඛ්‍යාව | 25 | 23 |
| බලශක්ති කළමනාකරුවන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 7 | 3 |
| බලශක්ති උපකරණ සේවා සැපයීම | උපකරණ දින | 1,710 | 1,220 |
| ප්‍රකාශනයට පත් කරන ලද බලශක්ති ලේබල්කරණ ප්‍රමිතීන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 2 | 2 |
| හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය වෙතින් තාක්ෂණික දැනුම ලබා දීම | සංඛ්‍යාව | 1,100 | 1,364 |
| සූර්ය බලශක්ති සේවා සමාගම් සමුච්චිත ලියාපදිංචිය සහ නියාමනය | සංඛ්‍යාව | 327 | 251 |
| ප්‍රකාශනයට පත් කරන ලද සූර්ය බලශක්ති ප්‍රමිතීන් | සංඛ්‍යාව | 1 | 2 |
| ආගමික සිද්ධස්ථාන/රජයේ ගොඩනැගිලි වහළ මත සවිකරන ලද සූර්ය බලශක්ති පද්ධති | සංඛ්‍යාව | 0 | 95 |
| පහසුකම් සලසන ලද පර්යේෂණ | සංඛ්‍යාව | 6 | 4 |
| ප්‍රකාශන | සංඛ්‍යාව | 8 | 7 |

1,011 GWh

කුඩා ජල විදුලිබල ව්‍යාපෘති වෙතින් සමුච්චිත උත්පාදනය



348 GWh

සුළං බලශක්ති ව්‍යාපෘති වෙතින් සමුච්චිත උත්පාදනය



464 GWh

සූර්ය බලශක්ති ව්‍යාපෘති වෙතින් සමුච්චිත උත්පාදනය



118 GWh

ජෛව ස්කන්ධ බලශක්ති ව්‍යාපෘති වෙතින් සමුච්චිත උත්පාදනය



738 GWh

බලශක්ති කාර්යක්ෂම උපකරණ මගින් බලශක්ති ඉතිරිය



# සුනිත්‍ය බලශක්ති ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්ති තුළින් ලඟාකරගත් ජයග්‍රහණ

**ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සකස් කිරීම**

**ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කිරීම මෙම අංශය තුළ විශාල ජයග්‍රහණයක් වේ.**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූලික අරමුණු හතරෙන් එකක් සපුරා ගනිමින්, 2019 වර්ෂයේ අගෝස්තු 09 දිනැති 2135/61 වන ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග ප්‍රකාශනයට පත් කිරීම සඳහා විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට තීරණාත්මක සහයෝගයක් ලබා දීමට අපි සමත් වීමු. එය බලශක්ති ක්ෂේත්‍රයේ සාර්ථක සන්ධිස්ථානයක් විය. කෘත්‍යාධිකාරී මණ්ඩලයක් විසින් මෙම ප්‍රතිපත්ති සකස් කරන ලද අතර අමාත්‍යාංශය විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් විසින් තවදුරටත් සමාලෝචනය කරන ලද මෙම ප්‍රතිපත්තිය ඉදිරි දශකයේ පළමු භාගය තුළ බලශක්ති ක්ෂේත්‍රය මෙහෙයවනු ඇත. බලශක්ති ප්‍රතිපත්තියේ ප්‍රධාන පරමාර්ථ වනුයේ පිරිසිදු, සුරක්ෂිත, ආර්ථික සඵලදායී හා විශ්වාසදායක සැපයුම් තුළින් බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම සහ ශ්‍රී ලංකාවේ සමාජීය සමානාත්මතා සංවර්ධනයට සහාය වීම සඳහා පහසු, දැරිය හැකි මිලකට බලශක්ති සේවා සැපයීම ය. මෙම ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ අනාගත අරමුණු, ගෝලීය ප්‍රවණතා සහ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කවල හත්වන ඉලක්කය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමිනි.

මෙම ප්‍රතිපත්තිය තුළින් 2050 වන විට සියලුම බලශක්ති වටිනාකම් දාමයන් සම්පූර්ණයෙන් සංක්‍රමණය කිරීම සහ මධ්‍යස්ථ කාබන් ප්‍රමාණයක් උදෙසා ශ්‍රී ලංකාවේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට මග පාදනු ඇත. මේ අනුව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය පහත දැක්වෙන ලෙස පාදක කරුණු දහයක් මත පදනම් වී ඇති අතර එය සමාජය, ආර්ථිකය සහ පරිසරය යන ආධාරක පුළුල් ලෙස ධාරණය කරයි. එය පිළිවෙලින් වැඩි දියුණු කළ සමානාත්මතාවය, ආරක්ෂාව සහ තිරසාරභාවය තුළින් බලශක්ති ක්‍රම සමතුලිත කිරීමේ උත්සාහයකි.

1. බලශක්ති ආරක්ෂාව සහතික කිරීම
2. බලශක්ති සේවාවන්ට ප්‍රවේශය ලබා දීම
3. ජාතික ආර්ථිකයට ප්‍රශස්ත පිරිවැයකින් බලශක්ති සේවා සැපයීම
4. බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය වැඩි දියුණු කිරීම
5. ස්වයං විශ්වාසය වැඩි දියුණු කිරීම
6. පරිසරය සුරක්ෂිත කිරීම
7. පුනර්ජනනීය බලශක්ති අංශය වැඩි දියුණු කිරීම
8. බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කිරීම
9. අනාගත බලශක්ති යටිතල පහසුකම් සඳහා ඉඩම් සුරක්ෂිත කිරීම
10. නවෝත්පාදන හා ව්‍යවසායකත්වය සඳහා අවස්ථා ලබා දීම



## සුළංබල

# 128.5 MW

## ව්‍යාපෘති සංඛ්‍යාව

# 15

උතුරු හා වයඹදිග වෙරළබඩ ප්‍රදේශවල නව විභව සුළං සම්පත් ස්ථාන හඳුනා ගැනීමත් සමඟ සුළං බලශක්ති විදුලි ජනනය ඉහළ යමින් පවතී. එය ජාතික බලශක්ති සැපයුම සඳහා ප්‍රධාන දායකත්වයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ.



# ආයතනික පාලනය



# ආයතනික පාලනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය කටයුතු කරනුයේ සාධාරණත්වය, සමානත්වය, අපක්ෂපාතීත්වය, විනිවිදභාවය හා වගවීම යන මූලධර්ම ගුරුකොට ගනිමිනි. සියලුම පාර්ශවකරුවන් සමග සවිමත් සබඳතා ගොඩනගමින් රටෙහි තිරසාර බලශක්ති සංවර්ධනය උදෙසා හිතකර පරිසරයක් පෝෂණය කිරීම වෙනුවෙන් අප අධිකාරියෙහි මූලධර්ම පිහිටුවා ඇත. ශ්‍රී ලාංකිකයන් සියලුම දෙනාගේ සුභසිද්ධිය උදෙසා ආචාරධාර්මික ප්‍රමිතීන්ට අනුගත වෙමින් අප අධිකාරියේ කටයුතු මෙහෙයවනු ලැබේ. රජයේ තිරසාර බලශක්ති ප්‍රතිපත්තියට අනුකූලව ව්‍යුහයන්, පද්ධති සහ ක්‍රියාවලීන් මෙන්ම අවශ්‍ය තොරතුරු සැපයීමට නිලධාරීන් තනි තනි වශයෙන් හා කණ්ඩායමක් ලෙස අප කැපවෙමු.

## කළමනාකරණ මණ්ඩලය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතෙහි විධිවිධාන ප්‍රකාරව අප වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමේ අවසන් වගකීම දරනුයේ කළමනාකරණ මණ්ඩලය විසිනි. විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සභාපතිවරයෙකුගේ නායකත්වය ඊට හිමි වේ.

## වගකීම

කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේ පනත විසින් පවරා ඇති බලතල ක්‍රියාවට නැංවීම, එමගින් පිහිටුවා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කිරීම සහ සපයා ඇති මූල්‍ය තොරතුරුවල නිරවද්‍යභාවය වෙනුවෙන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයන් නිසි ලෙස පවත්වා ගැනීමයි. අධිකාරියේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර කළමනාකරණ මණ්ඩලයේ පාලනයට යටත්ව ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරනුයේ එම නිලධාරියා විසිනි. මූල්‍ය අංශ අධීක්ෂණය කරන අනු කමිටුවක් වන විගණන හා කළමනාකරණ කමිටුව විසින් මණ්ඩලයට අවශ්‍ය සහාය සපයයි. මේ අතරම, අතිශය ශාස්ත්‍රීය හෝ වෘත්තීමය ස්වභාවයේ කාරණා සම්බන්ධ තීරණ ගැනීමේ අවශ්‍යතා උද්ගත වූ විට නිසි තීරණ ගැනීම උදෙසා පත් කරනු ලබන උපදේශක කමිටුවල සහයෝගයද කළමනාකරණ මණ්ඩලය වෙත හිමි වේ.

අධිකාරියේ ප්‍රසම්පාදන කටයුතු සියල්ලම සිදු කරනුයේ රජය විසින් අනුමත කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිද්දෙනි. අදාළ ප්‍රසම්පාදන කටයුත්තෙහි වටිනාකම මත පදනම්ව ස්වාධීන තාක්ෂණික ඇගයීම් කමිටුවක හා ප්‍රසම්පාදන කමිටු දෙකක මගපෙන්වීම යටතේ මෙකී කටයුතු අධිකාරියේ නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි.

## සංයුතිය

නිල බලයෙන් පත්වන සාමාජිකයින් 12 ක් සහ සභාපතිද ඇතුළුව පත් කරනු ලබන සාමාජිකයන් 9 දෙනෙකුද ඇතුළු 21ක් දෙනෙකුගෙන් කළමනාකරණ මණ්ඩලය සමන්විත වෙයි.

## කළමනාකරණ මණ්ඩල රැස්වීම්

සෑම මසකම කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්වේ. මෙකී රැස්වීම්වලදී අධිකාරියේ උපායමාර්ගික දිශානතිය සකස් කිරීම, සියලුම ක්‍රියාකාරකම්හි ප්‍රගතිය හා කාර්යසාධන සමාලෝචනය කිරීම සහ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වැඩසටහන් සැකසීම ආදී කටයුතු සිදු කරනු ලබයි. අධිකාරියේ නිලධාරීන් හට ස්වකීය යෝජනා මණ්ඩලය වෙත යොමු කිරීමට අවකාශයක් ලෙසද මෙකී රැස්වීම් ප්‍රයෝජනවත් වෙයි. සෑම රැස්වීමකටම පෙරාතුව කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් වෙත ප්‍රමාණවත් තරමේ ලේඛන ලබා දීමට පියවර ගැනේ.

2019 වසරේදී මෙකී රැස්වීම් සඳහා කළමනාකරණ මණ්ඩලයෙහි සහභාගීත්වය පහතින් දැක්වේ:

| රැස්වීම් අංකය | රැස් වූ දිනය | සහභාගීත්වය |
|---|---|---|
| 01/2019 | 2019 පෙබරවාරි 05 | 15 |
| 02/2019 | 2019 පෙබරවාරි 26 | 13 |
| 03/2019 | 2019 මාර්තු 26 | 15 |
| 04/2019 | 2019 අප්‍රේල් 11 | 14 |
| 05/2019 | 2019 මැයි 22 | 16 |
| 06/2019 | 2019 ජූනි 12 | 17 |
| 07/2019 | 2019 ජූලි 30 | 14 |
| 08/2019 | 2019 අගෝස්තු 27 | 12 |
| 09/2019 | 2019 සැප්තැම්බර් 25 | 7 |
| 10/2019 | 2019 ඔක්තෝම්බර් 10 | 11 |

## නෛතික අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීම

අධිකාරිය අදාළ පනතේ විධිවිධාන සහ රජය විසින් වරින් වරට පනවනු ලබන විවිධ රීති, රෙගුලාසි හා මාර්ගෝපදේශනයන්ට අනුකූලතාව දක්වන බව සහතික කිරීම සඳහා සෑම උත්සාහයක්ම කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. එසේම, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය සේවයට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතාවන්ට අනුකූල ලෙස පිළියෙළ කරනු ලබන බව සහතික කිරීමද මණ්ඩලය විසින් සිදු කෙරේ.

# අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය යනු නිසි ආයතනික පාලනයක ඉතාම වැදගත් කර්තව්‍යයක් බව අප අධිකාරිය වටහාගෙන සිටින අතර එම හේතුව නිසාම සුනිත්‍ය බලශක්තියට අදාළ වන පොදු අවදානම් සහ තවත් සුවිශේෂී අතිරේක අවදානම් හඳුනාගෙන ඇත. එකී සුවිශේෂී අවදානම් ප්‍රධාන වශයෙන්ම සම්බන්ධ වන්නේ බලශක්ති කාර්යක්‍ෂමතාව වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා අදාළ ප්‍රතිපත්ති පරිසරය වෙත ය. මේ නිසා කළමනාකරණ මණ්ඩලය විසින් අප අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත සුවිශේෂී අවධානයක් යොමු කොට ඇති අතර නිසි මූල්‍ය හා මෙහෙයුම් පාලන පද්ධති ක්‍රියාත්මක කර ඇති බව සහතික කරගැනීම එහි අරමුණයි. අභ්‍යන්තර විගණකවරුන් සහ කළමනාකරණ මණ්ඩලය විසින් එකී පද්ධතිවල සඵලදායීභාවය කලින් කලට සමාලෝචනය කරනු ලැබේ.

## අවදානම් පිළිබඳ සංස්කෘතිය

ස්වකීය අවදානම් තත්ත්වය කළමනාකරණ මණ්ඩලයේ සුපැහැදිලි අවධානයට ලක්ව ඇති අතර අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සුවිශේෂී ක්‍රියා පිළිවෙතක් පවත්වාගෙන යනු ලැබේ. ආචාරධාර්මික මූලධර්ම වෙත ස්වකීය කැපවීම ප්‍රකට කරමින් කළමනාකාරිත්වය විසින් තීරණ ගැනීමේදී සෑම විටම පාර්ශ්වකරුවන් සියලුම දෙනාගේ තත්ත්වය හා සුභසිද්ධියද සැලකිල්ලට ගනු ලැබේ. අපගේ කාර්ය මණ්ඩලයද එකී ආචාරධාර්මික මූලධර්මවල වටිනාකම වටහා ගෙන ඒ අනුව කටයුතු කරයි.

## අවදානම් හඳුනාගැනීම

අවදානම් හඳුනාගැනීමේදී බාහිර පරිසරය සමීපව නිරීක්‍ෂණය කිරීම අධිකාරිය නිරතුරුව සිදු කරයි. එසේම, හඳුනා ගැනෙන අවදානම් ගෝලීය බලශක්ති කර්මාන්තයට හා අප රටට සුවිශේෂී වන ආකාරය අනුව ඒවා වර්ගීකරණය කිරීමටද අධිකාරිය කටයුතු කරයි. මීට අමතරව, රටෙහි ප්‍රතිපත්තිමය පසුබිම සමීපව නිරීක්‍ෂණය කරමින් අනෙකුත් ජාතික ප්‍රතිපත්ති සමගද ගැලපෙන පරිදි අපගේ වැඩසටහන් සංවර්ධනය කෙරේ.

## අවදානම් කළමනාකරණය

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සහ බලශක්තිය අපතේ යාම අවම කිරීම ප්‍රමුඛතම අවධානිත ක්ෂේත්‍ර ලෙස අප අධිකාරිය විසින් සලකනු ලබන අතර ඒ අනුව ෆොසිල ඉන්ධන මිල ගණන් අඩු වීමේ ප්‍රධාන අවදානම් හඳුනා ගැනීමටද පියවර ගනියි. මෙය පුනර්ජනනීය බලශක්තිය වෙනුවට ඇති ඉතාම ලාභදායී විකල්පයක් බවට පත් වීමේ අවදානමක් ඇති අතර භාවිතා කරන්නන් අතින් බලශක්තිය අපතේ යාමටද එය හේතු විය හැකිය.

ඒ අනුව, ෆොසිල ඉන්ධන මිල අඩු මට්ටමක පවතින තත්ත්වයක් තුළ වුවද සුනිත්‍ය බලශක්ති සේවාවන්ට ඇති ඉල්ලුම අහිමි නොවන පරිදි අවම පිරිවැය තත්ත්වයක් දක්වා සුනිත්‍ය බලශක්ති වෙළෙඳපොල පරිවර්තනය කිරීමේ අරමුණින් අවදානම් කළමනාකරණ ක්‍රමෝපායක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අනුගමනය කරනු ලැබේ. සූර්ය බලශක්තිය තරගකාරී මිල තත්ත්වයක් දක්වා පරිවර්තනය කරමින් එකී කර්මාන්තය තුළ තරගකාරීත්වය ඉහළ නංවනු පිණිස නව ව්‍යාපාර රැසකට සූර්ය බලශක්ති සේවා සම්පාදකයන් බවට පත් වීමට ඉඩ සැලසීම තුළින් එය පෝෂණය කරන්නටද පියවර ගනු ලැබේ. ඒ හා සමානව, අඩු බලශක්ති හා ෆොසිල ඉන්ධන මිල ගණන් යටතේ වුවද බලශක්ති කාර්යක්ෂමතා සේවා සපයන සමාගම්වලට සිය කර්මාන්තයට හා ආර්ථිකයට අඛණ්ඩව සේවා සැපයීමට සහාය ලැබේ.

## සම්පත් අහිමි වීමේ අවදානම

රටේ පුනර්ජනනීය බලශක්ති සම්පත්වලට බලශක්ති සම්පත් ලබා ගැනීමේ හැකියාව අඩු කිරීම හෝ සම්පත් ලබා ගැනීමේ හැකියාව වෙනස් කිරීම වැනි විවිධ සාධක මගින් එය තවදුරටත් තර්ජනයට ලක්ව ඇත. ඉඩම් පරිහරණයේ වෙනස් වීම සහ විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙරට වටිනා පුනර්ජනනීය බලශක්ති සම්පත දැඩි බලපෑමට ලක් වෙයි. ජනාවාස පුළුල් වීමත් සමගින් සඵලදායී සුළං බලශක්ති ප්‍රභවයන් රැසක් අහිමි වීමේ අවදානමක්ද පවතී.  මේ අතරම, නිරන්තරව සිදු වන වනාන්තර හෙළි කිරීම්, වාණිජමය වගා ප්‍රදේශ ව්‍යාප්තිය සහ වර්ෂාපතන රටාවන් වෙනස්වීම ආදී හේතූන් නිසා අතීතයේදී ජල විදුලි උත්පාදනය සඳහා ඉතාම යෝග්‍ය වූ ජල ප්‍රභවයන්ද සැලකිය යුතු තරමින් වියැකී ගොස් තිබීමේ අවදානමක්ද අප හමුවේ ඇත.

එපමණක්ද නොව, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට එරෙහිව සිවිල් සමාජ සංවිධාන විසින් ගෙන ඇති ඇතැම් නීතිමය ක්‍රියාමාර්ග වැඩි වීම නිසාද අවදානම් මතුව තිබේ. 2019 වසර තුළ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගඋත්තරකරුවෙකු කරමින් ගොනු වූ නඩු සංඛ්‍යාව 3 දක්වා ඉහළ ගොස් ඇති අතරම සඵලදායී පුනර්ජනනීය බලශක්ති සම්පත් දැඩි ලෙස අහිමි වීමට එවන් පියවර හේතු වී ඇත.

මෙම සාධක දෙකම හේතුවෙන් පුනර්ජනනීය බලශක්ති සම්පත් ලබා ගත නොහැකි හිඟ තත්වයකට පත් කර ඇත.

## බලශක්ති සේවාවන්හි මිල ගණන් පහළ මට්ටමක පැවතීමේ අවදානම

විදුලිබල මිල ගණන් 2014 දී 25% ක මිල අඩු කිරීමකට ලක් වූ අතර එය බලශක්ති සේවා අංශයට බලපෑවේය. කාර්මික අංශය දිවා කාලයේ ඉතා අඩු තීරුබදු පනවමින් නිෂ්පාදන පිරිවැය පහත හෙලන ලදී. කර්මාන්තවලට මෙම ප්‍රතිලාභය ඉවත් කිරීමත් සමඟ බලශක්ති නාස්තිය අවම කිරීම සඳහා වූ උනන්දුව අඩු වී බලශක්ති කාර්යක්ෂමතා සේවා අංශයේ වෙළඳපල සැලකිය යුතු ලෙස හැකිලීමට මෙය හේතු විය. මේ පරිදිම කාර්මික තාපන අවශ්‍යතා සඳහා ෆොසිල ඉන්ධන යොදා ගැනීමද අඩු මට්ටමක පැවතීම නිසාද මෙකී ගැටළු ඉස්මතු විය. මහා පරිමාණයෙන් බලශක්ති කාර්යක්‍ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිවල නිරත වීම තුළින් සිය තිරසාරතා ඉලක්ක සාක්‍ෂාත් කර ගැනීමට සීමිත ආයතනික පාරිභෝගිකයන් පිරිසක් යොමු වීම නිසා මෙහෙයුම් පිරිවැය අඩුකර ගැනීමටත්, කාබන් විමෝචනය අවම කරගැනීමටත් හැකියාව ලැබුණි.

## අවදානම් නිරීක්‍ෂණය හා සමාලෝචනය

අධිකාරියේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් පවතින්නේද යන්න සහ ඒවායෙහි ක්‍රියාකාරීත්වය කාලීන වශයෙන් සමාලෝචනය කරනු ලැබෙන අතර අදාළ පාලන යාන්ත්‍රණයන්හි දුර්වලතා හඳුනාගෙන අවශ්‍ය වන අභ්‍යන්තර හා බාහිර වෙනස්කම් සිදු කිරීම එහි අරමුණයි.  සිදු කෙරෙමින් පවතින නිරීක්‍ෂණ කටයුතු හෝ වෙනම සිදු කරනු ලැබෙන ඇගයීම් කටයුතු සඳහා අවසන් වගකීම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ විගණන හා කළමනාකරණ කමිටුව සතු වන අතර අධිකාරියේ විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කරමින් පද්ධති පාදක විගණන කටයුතු සිදු කිරීමේ කටයුත්ත අභ්‍යන්තර විගණක විසින් සිදු කරනු ලබයි. අධිකාරියේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි සඵලදායීතාව වාර්ෂිකව සමාලෝචනය කොට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබේ.

# සූර්යබල

# 57.4 MW

## ව්‍යාපෘති සංඛ්‍යාව

# 14

පහත වැටෙන මිල ගණන් සමඟ, සූර්ය බලශක්තිය අනෙකුත් සියලු විදුලි උත්පාදන තාක්ෂණයන් සඳහා පවතින සියලු වියදම් අවම කරගැනීමට හේතු වේ.



# කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය



# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

සුනිත්‍ය බලශක්ති අධිකාරිය සිය කටයුතු ප්‍රධාන අංශ දෙකක් හරහා ක්‍රියාත්මක කරයි. ඒවා ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාකාරකම් (DSM) සහ සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම් (SSM) ය. මෙම උපායමාර්ගික අංශ දෙක තුළින් කර්මාන්තයට නියාමන අධීක්ෂණය මෙන්ම වර්ධන සහාය, දැනුවත්භාවය, බලශක්ති පර්යේෂණ සහ අධීක්ෂණයන් සපයයි. ජාතියේ සියලු පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරකම් සහ අනාගත අරමුණු සහ තිරසාර බලශක්ති කර්මාන්තයේ ගෝලීය සම්මුතීන්ට අනුකූලව ඉටු කිරීමට අධිකාරිය සහතික වේ.

සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම් තුළින් සම්පත් වෙන් කිරීම වැඩි කිරීම සහ ජාතික පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහන් කටයුතු නංවාලීම කෙරෙහි අවධානය යොමු කරයි. එතුළින් පැරිස් සම්මුතියේ අරමුණු ලඟාකර ගැනීමට සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජාතික පුනර්ජනනීය බලශක්ති න්‍යාය පත්‍රයට අනුව කටයුතු සපුරාලීමට මෙන්ම නව පුනර්ජනනීය බලශක්ති (NRE) ප්‍රභවයන්ගෙන් 11% කට වඩා වැඩි විදුලි ප්‍රමාණයක් පවත්වා ගෙන යාමට කටයුතු කරයි.

## පුනර්ජනනීය බලශක්ති උත්පාදනය

| පුනර්ජනනීය බලශක්ති ප්‍රභව | ව්‍යාපෘති ගණන | ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්) | විදුලිබල උත්පාදනය (GWh/වාර්ෂික) | $CO_2$ විමෝචන අඩු කිරීම (ටොන්/වාර්ෂික) |
|---|---|---|---|---|
| ජෛව ස්කන්ධය | 12 | 43 | 118 | 92 |
| ජල විදුලිය | 208 | 419 | 1,011 | 789 |
| සූර්ය ශක්තිය | 14 | 57 | 102 | 80 |
| සූර්ය වහල පද්ධති | 24,696 | 261 | 362 | 282 |
| සුළං බලශක්තිය | 15 | 128 | 348 | 272 |
| මුළු එකතුව | 24,945 | 908 | 1,941 | 1,515 |

SLSEA විසින් දීර්ග කරන ලද ව්‍යාපෘති පහසුකම් සැපයීමේ සේවාවන් වන්නේ,

- ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව සහ අභියාචනා කමිටුව හරහා ව්‍යාපෘති සඳහා අවශ්‍ය අවසරය ලබා දීම
- ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලියට අදාළ කරුණු සම්බන්ධයෙන් වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශ කිරීම
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම් ප්‍රගතිය අධීක්ෂණය හා සමාලෝචනය
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව රජයේ නිලධාරීන් අතර දැනුවත්භාවය වැඩි දියුණු කිරීම
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල තොරතුරු දත්ත සමුදාය යාවත්කාලීන කිරීම
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලට මැදිහත් වීම

SLSEA හි පිහිටුවා ඇති භූගෝලීය තොරතුරු පද්ධතිය පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල කටයුතු ක්‍රියාත්මක කිරීමට, සහය තොරතුරු සැපයීම ඇතුලු පහත කාර්යයන් සිදු කරයි.

- සූර්ය විභව සිතියම
- සුළං විභව සිතියම
- ගංගා සහ ඇළ පද්ධති, ගංගා ද්‍රෝණි සහ වැව්, ජලාශ
- සමෝච්ඡ දත්ත සහ ඩිජිටල් උන්නතාංශ ආකෘතිය
- මාර්ග ජාලය
- විදුලිබල ජාලය
- 1: 50,000 ඉඩම් පරිහරණය
- වන රක්ෂිත
- වනජීවී රක්ෂිත

### සූර්ය බල සංග්‍රාමය

වහල මත සූර්ය පද්ධති සවිකිරීමේ වැඩසටහන - 2016 දී දියත් කරන ලද සූර්ය බල සංග්‍රාමය 2018 දී මෙගාවොට් 100 ක සන්ධිස්ථානය පසුකරමින් වේගවත් ක්‍රියාවලියක් තුළින් කුඩා ප්‍රමාණයේ සූර්ය බල පද්ධති ව්‍යාප්ත කර ඒ මගින් ජාතික ඉලක්කයක් අත්පත් කර ගත්තේය. මෙම පසුබිම තුළ, ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සපයනු ලබන තාක්ෂණික සහාය සමඟින්, ගෘහ, රජය අංශය, ගොඩනැගිලි, ආගමික ආයතන, කාර්මික හා වාණිජ මට්ටමේ ආයතනවල සූර්ය බල පද්ධති 24,000 ක් සම්බන්ධ කරමින් මෙගාවොට් 261 ක සූර්ය පද්ධති ධාරිතාවයක් ලබා ගත් අතර ශුද්ධ මිනුම්කරණය, ශුද්ධ ගිණුම්කරණය සහ ශුද්ධ එකතු කිරීම හරහා රටේ වාර්ෂික විදුලි ඉල්ලුමෙන් 2.3% ක් සපුරාලීමට හැකි විය. සමාගම් 296 ක් හරහා සෘජු රැකියා 7,600 ක් සහ වක්‍ර රැකියා 5,000 කට ආසන්න සංඛ්‍යාවක් ලබා දෙමින් රට පුරා පුළුල් ලෙස සූර්ය පැනල කර්මාන්තයක් ඇති කිරීමට මෙය මග පෑදීය.



# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

## පියැසි සූර්ය බල පද්ධති සංවර්ධනය කිරීම




මූලාශ්‍රය: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) සහයෝගයෙන් ඉංජිනේරුවන් හා තාක්ෂණ ශිල්පීන් පුහුණු කිරීම හා ධාරිතාව ඉහළ නැංවීම සහ සූර්ය බල පද්ධති උපකරණ සඳහා අවශ්‍ය සියලු තාක්ෂණික ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ තාක්ෂණික මැදිහත්වීමට ඇතුළත් විය. සූර්ය බල තාක්ෂණය පිළිබඳ විධිමත් තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) හරහා සිදු කරන ලදී. සූර්ය බලශක්ති උත්පාදනය සඳහා රජය ආයතන සඳහා සෘජු තාක්ෂණික සහාය ලබා දෙන ලදී.



අවම පාරිසරික හා සමාජීය බලපෑම් සහිත විදුලි උත්පාදනයේ වටිනා විකල්ප ප්‍රභවයක් වන පියැසි සූර්ය පද්ධති විෂය පථය පුළුල් කිරීමට SLSEA කටයුතු කරමින් සිටී. මෙම ප්‍රයත්නයේ එක් ප්‍රධාන අංගයක් වන්නේ දෙමුහුන් ඉන්වර්ටර් තාක්ෂණය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමයි. ශ්‍රී ලංකා විදුලිබල ජාලය සඳහා සුදුසු සූර්ය ගබඩා පද්ධතියක් නියම කිරීමේ කාර්යය තාක්ෂණික කමිටුවකට පවරා ඇත. සූර්ය වහල පද්ධති මඟින් බෙදාහැරීමේ ජාලයන් ගැඹුරට ව්‍යාප්ත කිරීම හා සම්බන්ධ ගැටළු සාධාරණ ලෙස විසඳනු ලබන්නේ දිගුකාලීන බැටරියක් සහිත ස්ථානීය බලශක්ති ගබඩා පද්ධතියක් තුළිනි.

## ජාතික බලශක්ති උද්‍යානය - හම්බන්තොට

හම්බන්තොට පුනර්ජනනීය බලශක්ති උද්‍යානයේ සූර්ය බලශක්ති උත්පාදනය කිරීමේ පද්ධතිය මඟින් උපාධි අපේක්ෂකයින්ට, සිසුන්ට සහ දැනටමත් කර්මාන්තයේ නියැලී සිටින තාක්ෂණික කාර්ය මණ්ඩලයට අඛණ්ඩව පුහුණුව ලබා දෙන අතරම ගිගාවොට් පැය 1 ක හරිත බලශක්තියක් ජනනය කරයි.



## ජාත්‍යන්තර ජල විදුලි පුහුණු මධ්‍යස්ථානය - ඉඳුරාන

ක්ෂුද්‍ර ජල විදුලිබල කර්මාන්තයේ තවත් වැදගත් සන්ධිස්ථානයක් පසුකරමින් ශ්‍රී ලංකාවෙන් ලොවට විශේෂඥ දැනුම ලබා දෙන ස්ථානයක් වන ඉඳුරාන, සරත්චන්ද්‍ර රාජකරුණා ජල විදුලිබල ප්‍රවර්ධන ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය, ක්ෂුද්‍ර ජල විදුලි ආදර්ශ බලාගාරයට අනුබද්ධිතව ස්ථාපිතව කරන ලදී.



# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

## සම්පත් ගවේෂණය සහ සංවර්ධන සැලසුම්

විවිධ පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනා ගැනීම, විභව්‍යතා ස්ථාන ගවේෂණය කිරීම සහ සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහනේ එක් ප්‍රධාන අංශයකි. ජෛව ස්කන්ධ සම්පත් තක්සේරු කිරීම, සුළං සම්පත් තක්සේරු කිරීම, තරංග බලශක්ති සම්පත් තක්සේරු කිරීම, පුනර්ජනනීය බලශක්ති සම්පත් සිතියම් සංවර්ධනය කිරීම සහ සම්පත් ලේඛන සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම මේ යටතේ සිදු කරන ලදී.

### (අ) ජෛව ස්කන්ධ සම්පත් තක්සේරුව

බලශක්ති සම්පත් සිතියම් සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා ගත හැකි වන පරිදි පෙර වර්ෂවල ආරම්භ කරන ලද ජෛව ස්කන්ධ බලශක්ති සම්පත් තක්සේරු අධ්‍යයන අවසන් කරන ලදී. ජෛව ස්කන්ධ බලශක්ති සම්පත් ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි, ඒවා වැවිලි මගින් ලබා ගන්නා ජෛව ස්කන්ධ (Dendro) සහ කෘෂි අපද්‍රව්‍ය වේ.

**ජෛව ස්කන්ධ ඝනත්වය - බලශක්ති වැවිලි**




**ජෛව ස්කන්ධ ඝනත්වය - කෘෂි අපද්‍රව්‍ය**



# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

**(ආ) සුළං සම්පත් තක්සේරුව**

පසුගිය වසරවල ක්‍රියාත්මක කරන ලද සුළං සම්පත් තක්සේරු කිරීමේ ප්‍රතිඵලය වී ඇත්තේ රටේ ඉහළ සුළං බලශක්ති විභවයක් ඇති ප්‍රදේශවල සුළං බලශක්ති සම්පත් දත්ත ලබා ගැනීමයි. වර්තමානයේ සංවර්ධනය වෙමින් පවතින මන්නාරම සුළං බලශක්ති ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමට එය සහාය වී තිබේ. පුනර්ජනනීය බලශක්ති සම්පත් සිතියම සැකසීමේදී ද දත්ත පුළුල් ලෙස භාවිතා කර ඇත. සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයේ දී තථ්‍ය කාලීන භූගත දත්ත ලබා ගැනීම වඩාත්ම අපේක්ෂිත අංගයක් වන අතර, අනාගත කාල පරිච්ඡේදයන් ඉලක්ක කර ගනිමින් ඉහළ සුළං බලාගාර ධාරිතා එකතු කිරීම් ඇති බැවින්, ඉදිරි කාල පරිච්ඡේදයන් සඳහා අඛණ්ඩ දත්ත බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාපනය කර ඇති සුළං මිනුම් මධ්‍යස්ථාන වලින් සමන්විත ජාතික සුළං යොමු ජාලය භාවිතා කරමින් දිවයින පුරා සුළං සම්පත් තක්සේරු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

**(ඇ) තරංග බලශක්ති සම්පත් තක්සේරුව**

තරංග බලශක්තිය යනු රටේ නැගී එන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයකි. කුඩා පරිමාණ පර්යේෂණ ආකාරයේ මැදිහත්වීම් හැරුණු විට මෙම සම්පත සංවර්ධනය කිරීම සඳහා විශාල උත්සාහයක් ගෙන නොමැත. මෙම සම්පත සංවර්ධනය කිරීමේ ආරම්භක පියවර ලෙස, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ සහයෝගයෙන් තරංග බලශක්ති සම්පත් තක්සේරුවක් සිදු කරන ලදී.

**සුළං සම්පත් සිතියම (මීටර් 100 ක උසකින් යුත් සුළඟේ වේගය)**




*මූලාශ්‍රය: ගෝලීය සුළං සිතියම 3.0*

**ශ්‍රී ලංකාවේ තරංග බලශක්ති සම්පත් තක්සේරුව**



# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

### පුනර්ජනනීය බලශක්ති සම්පත් ලේඛන සහ සම්පත් සිතියම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතේ 7 වන වගන්තියට අනුකූලව පුනර්ජනනීය බලශක්ති සම්පත් සිතියම සහ පුනර්ජනනීය බලශක්ති සම්පත් ලේඛන සම්පාදනය කරන ලදී.




### පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම




ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතේ 8 වන වගන්තිය මගින් පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති අතර එය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම එම සැලැස්ම පුවත්පත්වල පළ කිරීම තුළින් අමාත්‍යවරයා විසින් මහජන අදහස් විමසනු ඇත. මෙම ක්‍රියාවලිය අනුගමනය කර මහජන අදහස් සඳහා කෙටුම්පත් සැලැස්ම ප්‍රකාශයට පත් කරන ලදී. සමාලෝචන අදියරේදී ඉඩම් වෙන්කිරීමේ ක්‍රියාවලිය ද වැඩිදුර සමාලෝචනයට ගත යුතුව තිබුණි. තවද, සම්ප්‍රේෂණ පද්ධතියක් තිබීම සහ ඉඩම් ලබා ගැනීමේ හැකියාව යන කරුණු තවදුරටත් සලකා බැලිය යුතු විය. ඒ අනුව, ඉඩම් ලබා ගැනීමට අදාළ හා ලං.වි.ම. බලධාරීන් සමඟ සාකච්ඡා කර කාරණය වඩාත් ප්‍රායෝගික මට්ටමකින් සොයා බලා සමාලෝචනයෙන් පසු සැලැස්ම ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

පුනර්ජනනීය බලශක්ති සම්පත් හතරක් එනම් ජල, ජෛව ස්කන්ධ, සූර්ය හා සුළං මේ යටතේ සලකා බලන ලදී.

### බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිවල මූලික සංවර්ධන මැදිහත්වීම්

මෙගාවොට් 100 හෝ ඊට වැඩි විශාල පරිමාණයන්හි සූර්ය බලශක්ති සහ සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීම තුළින් තරඟකාරී මිල ගණන් යටතේ ජාත්‍යන්තර ආයෝජකයින් ආකර්ෂණය කර ගනු ඇත. එබැවින් බලශක්ති උද්‍යාන ලෙස විශේෂිත ප්‍රමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගන්නා ලදී. පූනරීන් සූර්ය සුළං දෙමුහුන් බලශක්ති උද්‍යානය සහ සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති උද්‍යානය මෙයට සමගාමීව ගනු ලැබූ පළමු පියවරයන් දෙක වේ.

**(අ) පූනරීන් සූර්ය සුළං දෙමුහුන් බලශක්ති උද්‍යානය**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනරීන් ප්‍රදේශය සුළං හා සූර්ය බලශක්ති සංවර්ධනය සඳහා අපේක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර එම ප්‍රදේශයේ මෙගාවොට් 240 සහ මෙගාවොට් 800 ක ධාරිතාවයකින් යුත් සුළං හා සූර්ය බලශක්ති බලාගාර සංවර්ධනය කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබේ. ලෝක බැංකුවේ අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව (IFC) හා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ ජාතික ඒජන්සිය (NAPPP) සමඟ එක්ව SLSEA විසින් මූලික ව්‍යාපෘති සංවර්ධන කටයුතු සිදු කරන ලදී.



පූනරීන් සූර්ය සුළං දෙමුහුන් බලශක්ති උද්‍යානය

ව්‍යාපෘතිය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ අතර එහිදී ව්‍යාපෘතියේ පළමු කොටස ලෙස සූර්ය බලය මෙගාවොට් 130 ක් සහ සුළං බලය මෙගාවොට් 240 ක් සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘති සඳහා සෘජු ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 146 ක් සහ ඇමරිකානු ඩොලර් මිලියන 249 ක් ලෙස ගණන් බලා ඇත. පළමුව ස්ථාපනය කිරීමට නියමිත සූර්ය බලශක්ති උද්‍යානය යෝජිත 132 kV සම්ප්‍රේෂණ මාර්ගය හරහා කිලිනොච්චි ජාලක උපපොළට සම්බන්ධ කෙරේ.

# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

දෙවන අදියරේදී එය 220 kV දක්වා ඉහළ නංවන අතර වවුනියා ජාලක උපපොළට සම්බන්ධ වේ. කොළඹ විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා කුරුලු අධ්‍යයනය ද අවසන් කරන ලදී.

ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන විට ගිගාවොට් පැය 1,120 ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට හැකි වේ. මෙය රටේ සමස්ත වාර්ෂික බලශක්ති ඉල්ලුමෙන් 7.5% කි. ඊට අමතරව වාර්ෂිකව ටොන් 845,462 කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) විමෝචනය අඩු කර ගත හැකිය.

**(ආ) සියඹලාන්ඩුව සූර්ය බලශක්ති උද්‍යානය**




බලශක්ති උද්‍යාන සංවර්ධන වැඩසටහන යටතේ, පළමු මෙගාවොට් 100 සූර්ය බල උද්‍යානයක් මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට නියමිතය. මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 124/එච් කොටියාගල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ පිහිටි මෙම ව්‍යාපෘතිය සඳහා අක්කර 500 ක භූමි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම සොයා ගැනීම සම්බන්ධව මොනරාගල දිස්ත්‍රික් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මායිම් සෑදීම අවසන් කර ඇත. ඉඩම් පරිහරණ කමිටුව සහ මොණරාගල දිස්ත්‍රික් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ආයතන වලින් අනුමත කිරීම් කිහිපයක් ලබාගෙන ඇත. මෙම වර්ෂය තුළ පුරාවිද්‍යාත්මක වටිනාකම හා ජල සැපයුම පිළිබඳ අධ්‍යයන සිදු කරන ලදී. පාරිසරික බලපෑම් තක්සේරු කිරීම විශේෂිත විෂය ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති උපදේශන සමාගමක තාක්ෂණික සහාය ලබා ගනිමින් පවත්වන ලදී.

## බලශක්ති ප්‍රතිපත්ති සහ පර්යේෂණ

පුනර්ජනනීය බලශක්තිය ප්‍රභව වන සූර්ය බලශක්තිය සහ සුළං බලය සම්බන්ධ වැඩි ධාරිතාවක් අනාගතයේදී එකතු කිරීම තුළින් ඒ හරහා උපරිම දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, මෙම සම්පත් වල අස්ථායී ස්වභාවය මත මෙම සම්පත් මහා පරිමාණයෙන් උපයෝගී කර ගනිමින් විදුලිය අවශෝෂණය කර ගැනීමේ දුෂ්කරතා ඇති කරයි. එබැවින්, එය අදාළ විෂය කෙෂ්ත්‍රය තුළ පර්යේෂණ සඳහා ප්‍රධාන ක්ෂේත්‍රයකි. ඒ හා සම්බන්ධව, සූර්ය බලශක්තිය විදුලිබල පද්ධතියට ඒකාබද්ධ කිරීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති දෙකක් සම්පූර්ණ කරන ලද අතර, සූර්ය බලශක්තියේ අස්ථායී ස්වභාවය හේතුවෙන් ඇති වන ගැටළු සඳහා විසඳුම් හඳුනා ගැනීමට පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශයේ සහයෝගය ලබා ගන්නා ලදී.

**(අ) DC ක්ෂුද්‍ර ජාල හරහා සූර්ය බල පද්ධති කාර්යක්ෂමව භාවිතා කිරීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය**

DC ක්ෂුද්‍ර ජාල හරහා සූර්ය බල පද්ධති කාර්යක්ෂමව භාවිතා කිරීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් පහත සඳහන් අරමුණු සහිතව සිදු කරන ලදී.

- උපයෝගිතා සම්බන්ධතාවයක්, සූර්ය පැනල සහ බලශක්ති ගබඩා ඒකකයකින් යුත් DC ක්ෂුද්‍ර ජාලයක සැලසුම, පාලනය සහ ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීම.
- බලශක්ති ගබඩා කිරීම සඳහා ගතවන කාලයේ වෙනස්වීම සහ පුනර්ජනනීය නිමැවුම් වල බලපෑම විමර්ශනය කිරීම.
- DC ක්ෂුද්‍ර ජාල වල සුපිරි ධාරිත්‍රකවල යෙදීම් විමර්ශනය කිරීම
- පුනර්ජනනීය බලශක්ති භාවිතය උපරිම කිරීම සහ උපයෝගිතා බලයේ යැපීම අඩු කිරීම සඳහා ගබඩා ධාරිතාව පාලනය කරන බලශක්ති කළමනාකරණ පද්ධතිය (EMS) විමර්ශනය කිරීම.

මෙම අධ්‍යයනයට අනුව, Dc-Dc පරිවර්තකයක් හරහා සූර්ය බල පද්ධති විදුලි ජාලයකට අන්තර් සම්බන්ධ කිරීමෙන් 10% කට වඩා බලශක්ති ඉතිරියක් ලැබෙන බව නිරීක්ෂණය වී ඇත. DC ජාලයකට සම්බන්ධ කර ඇති සූර්ය බල පද්ධති වලින් උපරිම වාසිය ලබා ගැනීම සඳහා, DC සම්බන්ධිත LED විදුලි පහන්, පරිගණක උපකරණ සහ වායුසමීකරණ යනාදිය සෘජුවම DC පද්ධතියට සම්බන්ධ කළ යුතුය. තවද, බැංකුවක ඇති LED විදුලි පහන්, පරිගණක උපකරණ සහ වායුසමීකරණ යන්ත්‍ර සූර්ය බලශක්ති මගින් බල ගැන්වෙන DC ජාලයකට සම්බන්ධ කර ඇත්නම්, විදුලි බිල සූර්ය පැනලයකට අනුරූප විය හැකිය. තවද, ගොඩනැගිලිවල මෙන්ම විදුලිබල පද්ධතියේ හඳුනාගත් භූගෝලීය මායිම්වල බලශක්ති ගබඩා පද්ධති (ESS) භාවිතා කරමින් සූර්ය බලශක්තිය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා බලශක්ති කළමනාකරණ පද්ධති භාවිතා කරමින් පද්ධති ප්‍රශස්තිකරණය කිරීම අවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ, DC ක්ෂුද්‍ර ජාලය සුදුසු තාක්ෂණික මැදිහත්වීමක් වනු ඇත. ව්‍යාපෘති ප්‍රතිඵල මඟින් එවැනි අවස්ථා වලදී පද්ධති ප්‍රශස්තිකරණය සඳහා විවිධ වින්‍යාසයන් පිළිබඳ දැනුමක් ලබා දෙනු ඇත.

# සැපයුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

**(ආ) සූර්ය බලය මහා පරිමාණයෙන් යෙදවීමත් සමඟ සැපයුමේ ආරක්ෂාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ සූර්ය බලය මහා පරිමාණයෙන් යෙදවීමත් සමඟ සැපයුමේ ආරක්ෂාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය පහත සඳහන් අරමුණු සහිතව සිදු කරන ලදී.

- සුදුසු සහසම්බන්ධතා උපක්‍රම භාවිතා කරමින් විදුලිබල පද්ධතියට සම්බන්ධ විදුලි බලාගාරවල සූර්ය බල ප්‍රතිදානයන්හි වෙනස්කම් තක්සේරු කිරීම සහ ප්‍රමාණනය කිරීම
- උත්පාදනය හා සැගවුනු ඉල්ලුමේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගනිමින් විදුලිබල පද්ධතියේ සංචිත අවශ්‍යතා තක්සේරු කිරීම
- විදුලිබල පද්ධතිය විවිධාකාර පුනර්ජනනීය උත්පාදනයන් සමඟ ආකෘතිකරණය කිරීම සහ ගතික අධ්‍යයනයන් සිදු කිරීම

මෙම අධ්‍යයනයට අනුව, 2018-2028 කාල සීමාව තුළ ධාරිතාවේ වෙනස්වීම් සඳහා සංචිතය 2.8-4.7% සිට ඉහළට සහ පහළට නියාමනය කරන අතර 2020 න් ඔබ්බට පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය 10% සිට 20% දක්වා ඉහළ නැංවීම සමස්ත සාමාන්‍ය සංචිත අවශ්‍යතාවයෙන් 4.45% සිට 7.5% දක්වා වැඩි වීමකි. සූර්ය බලශක්තිය පිළිබඳ පුරෝකථනයන්හි අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගනිමින් සංචිත සහ සංචිත මෙහෙයුම් පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රම තුනක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, විදුලි ඉල්ලුම නිවැරදිව තක්සේරු කිරීමේ ක්‍රමවේදය සඳහා සූර්ය බලශක්ති උත්පාදනය හොඳ නිරවද්‍යතාවයකින් පුරෝකථනය කිරීම අවශ්‍ය වේ. තවද, ගතික සංචිත ආන්තිකය භාවිතා කිරීම අවම මෙහෙයුම් පිරිවැය සහතික කරන අතර අවම සංචිත ප්‍රමාණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

### විදුල්කා ජාතික බලශක්ති සම්මන්ත්‍රණය සහ නවෝත්පාදන සංසදය

තිරසාර බලශක්ති සංවර්ධන ක්‍රියාවලියේදී ඔවුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන, වෘත්තීය ආයතන ආදියෙහි පර්යේෂකයන්ගෙන් උපදෙස් ලබා ගැනීමේ අරමුණින් විදුල්කා ජාතික බලශක්ති සම්මන්ත්‍රණය පවත්වන ලදී. බලශක්ති ප්‍රතිපත්ති හා සැලසුම්, විදුලි ඉංජිනේරු විද්‍යාව, තාප බලශක්ති පද්ධති, රසායනික ඉංජිනේරු විද්‍යාව, බලශක්ති කළමනාකරණය, ජෛව ස්කන්ධ ශක්තිය, සූර්ය බලශක්තිය, තරංග ශක්තිය සහ භූතාපජ ශක්තිය වැනි විවිධ විෂය ක්ෂේත්‍රයන් ඇතුළු පුළුල් පරාසයක පර්යේෂණ පත්‍රිකා සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කරන ලදී. පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් අනුවර්තනය කිරීමේ නවෝත්පාදනයන් ද මෙහි ප්‍රධාන අංගයක් වන අතර මේ වසරේ නවෝත්පාදන සංසදය සූර්ය බලශක්තිය සඳහා ඉලක්ක කරන ලදී. සූර්ය විදුලිය සහ සූර්ය තාප පද්ධති යන දෙකෙහිම වටිනා නවෝත්පාදනයන් මෙහිදී ඉදිරිපත් කරන ලදී.






### බලශක්ති ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

බලශක්ති අංශයට අදාළ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සුනිත්‍ය බලශක්ති අධිකාරිය, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපාය මාර්ග 2019 ප්‍රකාශයට පත් කරන ලද අතර එය බලශක්ති ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් සන්දර්භය තුළ ඉතා වැදගත් පියවරක් වනු ඇත. මෙය SLSEA හි ප්‍රධාන අරමුණු වලින් එකක් වන ප්‍රතිපත්ති සංවර්ධනය යටතේ එන ප්‍රධාන මැදිහත්වීමකි.

## පියැසි සූර්ය පද්ධති

# 261 MW

## සම්බන්ධිත ගිණුම්

# 24,696

පුනර්ජනනීය බලශක්තිය සහ පාරිසරික සංරක්ෂණය සම්බන්ධ ගෝලීය නැඹුරුතා තුළ 2019 වසරේදී ගෘහස්ථ සූර්ය බලශක්ති භාවිතය ඉදිරි පිම්මක් තබන ලදී.



# ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

## බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ සංරක්ෂණය

බලශක්ති සංරක්ෂණය සම්බන්ධයෙන් වාණිජ, කාර්මික හා ගෘහස්ථ අංශ කේන්ද්‍ර කරගනිමින් පහත සඳහන් කාණ්ඩ තුන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- නියාමන මැදිහත්වීම්
- බලශක්ති කාර්යක්ෂමතා සේවා ශක්තිමත් කිරීම
- පුහුණුව හා දැනුවත් කිරීම.

2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත දැක්වෙන කොටස් වලින් දැක්වේ.

## බලශක්ති කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලශක්ති කළමනාකරණ වැඩසටහන, බලශක්ති විගණන වැඩසටහන, බලශක්ති පරිභෝජන මිණුම් සලකුණු ස්ථාපිත කිරීම වැනි දිගු කාලීන වැඩසටහන් මගින් වාණිජ, කාර්මික හා දේශීය අංශවල බලශක්ති සංරක්ෂණයට පහසුකම් සපයයි.

**• බලශක්ති කළමණාකරුවන් සංඛ්‍යාව ඉහළ නැංවීම.**

මේ වසරේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරීන් විවිධ කර්මාන්ත හරහා බලශක්ති කළමනාකරුවන්ගේ සංඛ්‍යාව උපායමාර්ගිකව ඉහළ නැංවීමට මූලික පියවර ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 දී බලශක්ති කළමනාකරුවන් 7 දෙනෙකු පත්කිරීම කරන ලද අතර, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි සමස්ත බලශක්ති කළමනාකරුවන් 223 දක්වා ඉහළ නංවා ඇත. ආයතන තුළ බලශක්ති පරිභෝජනය කාර්යක්ෂම කිරීම, නාස්තිය අවම කිරීම සහතික කිරීම සහ තිරසාර බලශක්ති කළමනාකරණය සඳහා බලශක්ති කළමනාකරුවන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දේශීය සමාගම්වල එදිනෙදා කටයුතු තුළින් කාබන් විමෝචනය වැඩි කිරීමට දායක වන බලශක්ති නාස්තිය අවම කිරීම සඳහා බලශක්ති කළමනාකරුවන් වගකිව යුතුය.

**• අනුගම්‍ය බලශක්ති සංරක්ෂණ මූල පිරීම්**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ එක්ව ඊට පෙර රාජ්‍ය ආයතනයන්ගේ සහභාගීත්වය අනිවාර්ය නොවූ රාජ්‍ය චක්‍රලේඛයක් සංශෝධනය කරමින් රාජ්‍ය ආයතන තුළ බලශක්ති සංරක්ෂණය පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, සෑම රජයේ ආයතනයකටම බලශක්ති කළමනාකරුවෙකු හඳුනාගෙන පත් කිරීම අනිවාර්ය වේ. ඔහු බලශක්ති නාස්තිය අවම මට්ටමක තබා ගැනීම සහ ආයතනය තුළ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහතික කරනු ඇත. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විශ්වාස කරන්නේ මෙය රටේ සමස්ත බලශක්ති පරිභෝජනය අඩු කිරීමට දායක වෙමින් රාජ්‍ය ආයතන තුළ සැලකිය යුතු බලශක්ති පරිභෝජනයක් ඉතිරි කරනු ඇති බවයි.

**• බලශක්ති කළමනාකරණය පිළිබඳ රාජ්‍ය අංශයේ දැනුවත්භාවය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරීන්ගේ ඉහත උත්සාහයන්ට සහය දැක්වීම පිණිස, ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති අරමුණු සඳහා ඔවුන්ගේ කාර්යභාරය සහ දායකත්වය පිළිබඳව බලශක්ති කළමනාකරුවන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ මාලාවක් 2019 දී පවත්වන ලදී. වර්ෂය තුළ මාතලේ (සහභාගී වූවන් 130), බදුල්ල (සහභාගී වූවන් 200) සහ මොණරාගල (සහභාගී වූවන් 100) යන ප්‍රදේශයන් හි වැඩමුළු තුනක් පැවැත්විණි.

**• බලයලත් බලශක්ති විගණකවරුන් ලියාපදිංචි කිරීම**

පුද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයේම බලශක්ති සංරක්ෂණය මෙන්ම බලශක්ති කළමනාකරණය අධීක්ෂණය හා පාලනය කිරීම සඳහා බලශක්ති විගණකවරුන් වැදගත් වේ. ප්‍රමාණවත් බලශක්ති විගණකවරුන් නොසිටීම නිසා, කර්මාන්තශාලා සහ සේවා ස්ථානවල බලශක්ති භාවිතය තක්සේරු කිරීම සහ වැඩිදියුණු කිරීම ප්‍රමාද කරනු ඇත. 2019 දී බලයලත් බලශක්ති විගණකවරුන් 2 නෙක්ව පැවති විගණකවරුන්ගේ මුළු සංඛ්‍යාව 20 දකවා වැඩි කිරීම.

## ප්‍රමිති සහ රෙගුලාසි හඳුන්වා දීම

ගෘහස්ථ කාර්මික හා වාණිජ යන සෑම අංශයකම බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නියාමන මැදිහත්වීම් සහ දැනුවත් කිරීම් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර තිබේ.

**• ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති නිවාස සඳහා මාර්ගෝපදේශ**

වසර ගණනාවක් තිස්සේ තිරසාර බලශක්ති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම බොහෝ දුරට කාර්මික හා ආයතනික අංශවලට සීමා වී ඇත. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ, ගෘහස්ථ පාරිභෝගිකයන් පුනර්ජනනීය බලශක්ති භාවිතයට මාරුවීම ඉහළ ගොස් ඇති අතර, බලශක්ති සංරක්ෂකයන් වීම සඳහා ගෘහස්ථ අංශයේ වැඩි දැනුමක් හා උනන්දුවක් පෙන්නුම් කරයි. තිරසාර බලශක්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගෘහස්ථ අංශයේ විභවය අවබෝධ කරගත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති නිවාස සඳහා වූ මාර්ගෝපදේශය සකස් කර නිකුත් කරන ලද අතර එමඟින් නිවැසියන්ට ගොඩනැගිලි පිළිබඳ මාර්ගෝපදේශ සපයනු ඇත. මේ වන විට මෙම ප්‍රකාශනයේ පිටපත් 250 ක් සංසරණය වී ඇත.

**• බලශක්ති මාර්ගෝපදේශ දැනුවත් කිරීමේ සංසදය**

ශ්‍රී ලංකාවේ තිරසර බලශක්ති නිවාස සඳහා වන මාර්ගෝපදේශය පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පාර්ශ්වකරුවන්ගේ සංසදයක් පිහිටවන ලදී. බලශක්ති කාර්යක්ෂම නිවාස ඉදිකිරීමේදී මෙම මාර්ගෝපදේශ ඇතුළත් කළ හැකි ආකාරය පිළිබඳව ගෘහ නිර්මාණ ශිල්පීන්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් අදාළ කර්මාන්ත පාර්ශ්වකරුවන් ආදී ඉදිකිරීම් අංශයේ වෘත්තිකයින්ට දැනුම ලබා දෙන ලදී.

**• බලශක්ති කාර්යක්ෂම උපකරණ වැඩසටහන**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාවට නංවන සහ අධීක්ෂණය කරනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස බලශක්ති කාර්යක්ෂම උපකරණ වැඩසටහන දැක්විය හැකිය. බලශක්ති පරිභෝජනය කරන නිෂ්පාදන සහ උපකරණ භාවිතයේ දී මෙන්ම අලෙවිකරණ ක්‍රියාවලියේදී ද යම් ප්‍රමිතීන් අනුගමනය කරන බව මෙයින් සහතික කෙරේ. විදුලි උපකරණ සඳහා බලශක්ති ලේබල් මඟින් පාරිභෝගිකයින්ට බලශක්ති පරිභෝජනය ශ්‍රේණිගත කිරීම සහ හොඳම භාවිතයන්ට අනුකූල වීම තහවුරු කිරීමට මඟ පෙන්වයි.

# ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

2019 සඳහා උපකරණ බලශක්ති ලේබල් කිරීමේ ප්‍රගතිය සවිස්තරාත්මක දැක්වීමක් පහත වගුව පෙන්වයි.

| විස්තරය | ලද ප්‍රගතිය |
|---|---|
| LED පැනල් සඳහා අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිය | • අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මිලදී ගෙන ඇත<br>• පරීක්ෂා කිරීම සහ මිණුම් ලකුණ සැකසීම සඳහා විවිධ නිෂ්පාදකයින්ගෙන් LED මොඩියුල මිලදී ගැනීම සිදු කර ඇත<br>• ප්‍රමිති සකස් කිරීම සිදු වෙමින් පවතී |
| සිවිලිම් විදුලිපංකා සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන | • ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි ස්ථාපිත පර්යේෂණ ධාරිතාවය පූර්ණ ලෙස උපයෝජනය කර ඇත<br>• අනිවාර්ය බලශක්ති ලේබලය පිළිබඳ සිවිලිම් විදුලි පංකා ආනයන සමාගම් දැනුවත් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ සංසදයක් කැඳවීය<br>• සිවිලිම් විදුලි පංකා බලශක්ති ලේබලය පිළිබඳ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම සඳහා ලංසු කැඳවූ අතර කාර්යය ප්‍රදානය කරන ලදී |
| පරිගණක සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන | • මොරටුව විශ්ව විද්‍යාලයේ පරිගණක පරීක්ෂණාගාරයක් ආරම්භ කරන ලදී<br>• ස්වේච්ඡා බලශක්ති ලේබලය පිළිබඳව පරිගණක නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් දැනුවත් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ සංසදයක් කැඳවා ඒ සඳහා වූ ක්‍රියාකාරකම් දියත් කරන ලදී |
| ශීතකරණ සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන | • ප්‍රමිතිය කෙටුම්පත් කිරීම අවසන් කොට ආංශික කමිටුවේ අනුමැතිය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත යවන ලදී<br>• ආකෘති කිහිපයක් බලශක්ති කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂණයකට භාජනය විය |
| LED ලාම්පු සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන | • අනිවාර්ය අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිති ලේබලය නියාමනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත |

## උපදේශනාත්මක මඟ පෙන්වීම හා සේවා සැපයීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් විමසීම්වලට පිළිතුරු සැපයීම, උපදේශන සේවා සැපයීම, ඉල්ලීම මත දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් කර්මාන්ත, වාණිජ හා රාජ්‍ය අංශයේ ආයතනවලට ඔවුන්ගේ බලශක්ති සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වේ. බලශක්ති විගණන කටයුතු සඳහා භාවිතා කිරීමට හොඳින් නඩත්තු කරන ලද මිනුම් උපකරණ සංචිතයක් (බැංකුවක්) පවත්වාගෙන යනු ලැබේ. බලශක්ති විගණනයන් සිදු කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ විශේෂිත සේවාවන් සැපයීම වෙනුවෙන් අධිකාරිය බලශක්ති සේවා සමාගම් ලියාපදිංචි කර ඇත.

උපදේශන සහ සේවා සැපයීම මත ක්‍රියාත්මක කරන සමහර ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- මිනුම් උපකරණ මිනුම්කරණ සේවා සඳහා යෙදවීම - උපකරණදින 1,710
- මිනුම් උපකරණ සංචිතය සඳහා රැගෙන යා හැකි ආකාරයේ විදුලි ධාරිතා මීටර් (Portable Power Meter) 2 ක් සහ ආලෝක තීව්‍රතා මීටර 5 ක් මිලදී ගෙන ඇත
- බලශක්ති කළමනාකරණ සේවා සමාගම් 44 ක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි කර ඇත
- නැව් තටාකාංගනය (Dockyard), ගලේවෙල ප්‍රාදේශීය රෝහල, දඹුල්ල සහ මාතලේ දිස්ත්‍රික් මහ රෝහල් වැනි ආයතනවල බලශක්ති විගණන 4 ක් පැවැත්වීම
- DSI රජරට ටයිල් කර්මාන්තශාලාවේ විදුලි ඉල්ලුම මැනීම සහ විශ්ලේෂණය
- SLSEA විසින් ගිස්ලේවේඩ් ගුම්මි ලංකා (පුද්ගලික) සමාගම, ජෙට්විං ලැගූන් හෝටලය, නුවරඑළියේ ශාන්ත ඇන්ඩෲස් හෝටලය, ඉඳුරුව බීච් රිසෝට් බෙන්තොට සහ නුවරඑළියේ හෙරිටන්ස් තේ කර්මාන්තශාලාව යන ආයතන වල ISO 50001 බලශක්ති කළමනාකරණ පද්ධති (EnMS) විගණන 5 ක් සිදු කරන ලදී.
- ජාතික වින්දිතයින් ආරක්ෂා කිරීමේ අධිකාරිය සඳහා වායු සමීකරණ තෝරා දීමට අදාල තීරණ ගැනීම.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා කාර්මික කලාපවල බලශක්ති විගණන 15 ක් සඳහා උපදේශනය පවත්වන ලදී.

## බලශක්ති දත්ත හා සංඛ්‍යාලේඛන සකස් කිරීම හා බෙදා හැරීම

- 2017 බලශක්ති තුලනය සහ ප්‍රධාන බලශක්ති සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇත. බලශක්ති තුලනය 2018 පිළිබඳ දත්ත සත්‍යාපනය සිදු වෙමින් පවතී.

## පර්යේෂණ හා සංවර්ධනය

ශ්‍රී ලංකාවේ බලශක්ති කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා නව නිපැයුම් තාක්ෂණයන් අනුගමනය කිරීමේ හැකියාව ගවේෂණය කිරීමට මූලික පියවර ගන්නා ලදී.

තේ පර්යේෂණ ආයතනයේ සහාය ඇතිව බලශක්ති කාර්ය සාධනය නිවැරදිව තක්සේරු කිරීමට උපකාරී වන නවීකරණය කරන ලද නල, රේඩියේටර්, ක්‍රියාවලි පාලනය සහ පැතිරීමේ යාන්ත්‍රණය ඇතුළු තේ වියලීම සිදුවන පද්ධතියක මූලාකෘතියක් නිර්මාණය කර ඇත.

## බියගම පිහිටි ත්‍රිත්ව ජනන පද්ධතිය

බියගම අපනයන සැකසුම් කලාපයේ බලශක්ති ප්‍රශස්තකරණය සහ බලශක්ති නාස්තිය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නියමු ව්‍යාපෘතියක් පවත්වන ලදී. තෝරාගත් කර්මාන්තශාලා වල සිදුවන නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලීන් සහ මෙම එක් එක් අදියරවල බලශක්ති පරිභෝජනය මෙම ව්‍යාපෘතිය තුළ දී සැලකිල්ලට ගෙන ඇත. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වන ආදාන ශක්තියෙන් හිමැවුම් ශක්තිය බවට පත්වීමේදී සැලකිය යුතු කොටසක් ඌන උපයෝජනය වී ඇති බව ව්‍යාපෘතිය විසින් හඳුනාගෙන ඇත. කර්මාන්තවල බලශක්ති පරිභෝජනය කළමනාකරණය කිරීමේදී ද්විනිෂ්පාදනයක් ලෙස වර්ධනය වූ අතිරික්ත ශක්තිය තවදුරටත් ප්‍රශස්ත ලෙස භාවිතා කළ හැකි ආකාරය ව්‍යාපෘතිය මගින් ගවේෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාර්මික ක්‍රියාවලීන් සඳහා මධ්‍යගත තාප ශක්ති පද්ධති භාවිතය හඳුනා ගන්නා ලදී.

# ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාර්මික ක්‍රියාවලීන් සඳහා බොහෝ කර්මාන්තවල භාවිතා කළ හැකි වටිනා බලශක්ති සම්පතක් ලෙස මධ්‍යගත තාප ශක්තිය හඳුනා ගන්නා ලදී. එය කාර්මික ක්‍රියාවලීන් සඳහා අවශ්‍ය වන විදුලිය, සිසිලනය සහ තාපය සඳහා භාවිතා කළ හැක.

මෙම ශක්‍යතා අධ්‍යයනය ත්‍රිත්ව පරම්පරාවක් සඳහා කුරුණෑගල ISB හි සහය ඇතිව සිදු කරන ලද අතර බියගම කාර්මික කලාපය තුල බලශක්ති සම්පත්වල යෙදවුම් සහ නිමැවුම්හී නැවත භාවිතා කිරීම සඳහා වන බහු විභවය ගවේෂණය කරයි. එමඟින් බලශක්ති නාස්තිය අවම කරමින් බලශක්ති භාවිතය ප්‍රශස්ත කල හැක. කාර්මික කලාප සඳහා ස්ථානීය බලශක්ති සැකසුම් හැකියාවක් සහිත බලශක්ති සැපයුම් උපයෝගීතා මධ්‍යගත තාපයක ගුණාංග විදහා දක්වමින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත අවසාන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

### ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ මෙහෙයුම් වැඩසටහන

බලශක්ති කාර්යක්‍ෂමතා ඉහළ නැංවීම හා සංරක්‍ෂණ වැඩසටහන සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය බලශක්ති ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ මඟ පෙන්වීම යටතේ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ මෙහෙයුම නමින් ජාතික වැඩසටහනක් ආරම්භ කළේය. 2017 දී දියත් කරන ලද වැඩසටහනට වැඩසටහන් සැලසුමේ අපේක්ෂිත පරිදි මූල්‍ය හා මානව සම්පත් ලබා ගත නොහැකි විය. එසේ වුවද, දැඩි බාධාවන් යටතේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. බලශක්ති ඉල්ලුම අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් හඳුනාගෙන ඇති අංශ දහය හා එහි තත්ත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ:

**කාර්යක්ෂම වායු සමීකරණ**

කාමර වායු සමීකරණ පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ පද්ධතියක් සැකසීම සඳහා ජාත්‍යන්තර අරමුදල් සඳහා යෝජනාවක් සකස් වෙමින් පවතී.

**කාර්යක්ෂම ආලෝකකරණය**

වාණිජ ගොඩනැගිලි 100 ක් පිළිබඳ අධ්‍යයනයක් අවසන් කරන ලදී. අධ්‍යයනයෙන් පෙන්නුම් කළේ කාර්යක්ෂම ආලෝකකරණය මගින් වසරකට දළ වශයෙන් ගිගාවොට් පැය 515 ක විදුලි ශක්තියක් ඉතිරි කර ගත හැකි බවයි.

**කාර්යක්ෂම ශීතකරණ**

පාවිච්චි කරන ලද ශීතකරණ 10,000 ක් ප්‍රතිස්ථාපනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් සැලසුම් කරමින් පවතී. පැරණි ශීතකරණ වෙනුවට ආදේශ කිරීම සඳහා දිරිගැන්වීමක් ලෙස විදුලි බිල්පතේ කුලී මිලදී ගැනීමේ වාරික ගෙවීම් මෙම ව්‍යාපෘතියේ අරමුණයි. දැනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කුලී මිලදී ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. මේ අතර, පැරණි ශීතකරණවලින් ඉවතලන ශීතකාරක ගබඩා කිරීම සඳහා ගබඩා සිලින්ඩර මිලදී ගැනීම සිදු වෙමින් පවතී.

**කාර්යක්ෂම සිසිලන**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහයෝගයෙන් සිසිලන ආදේශ කිරීම පිළිබඳ නියමු ව්‍යාපෘතියක් දියත් කරන ලද අතර එය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කිරීම සම්බන්ධව කටයුතු කරමින් තිබේ.

**කාර්යක්ෂම මෝටර් සහ විචල්‍ය වේග ධාවක**

කාර්මික අංශයේ ප්‍රේරක මෝටර පිළිබඳ අධ්‍යයනයකින් හෙළි වූයේ මෝටර් ආදේශනය මගින් වැඩි කාර්යක්ෂමතාවයක් අත් කරගත නොහැකි බවයි. එම අධ්‍යයනයෙන් විචල්‍ය වේග ධාවකයන් හඳුන්වා දීමේ විෂය පථයක් අනාවරණය විය. මෝටර් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර සමීක්ෂණයට සහභාගී වූ කර්මාන්ත විසින් යෝජනා 3 ක් ඉදිරිපත් කරන ලදී. ඉතිරි කිරීම්, අවශ්‍ය ආයෝජනය සමග සන්සන්දන නොවන නිසා යෝජනා තුනම ශක්‍යතාවයෙන් තොර වේ.

**තාපදීප්ත ලාම්පු ඉවත් කිරීම**

වැඩසටහනේ පළමු අදියර, මසකට කි.වො. 30 ට අඩු පාවිච්චියක් ඇති පවුල් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලදී. වෙනස් කැපවීම් මට්ටම් සඳහා ප්‍රතිචාර දක්වන උපයෝගීතා දෙවර්ගයකින් යුත් විවිධ බෙදාහැරීම් ක්‍රම තුළින් මෙම වැඩසටහන යහපත් සාර්ථකත්වයක් අත්කර ගත්තේය. පූර්ව හා පසු ක්‍රියාත්මක කිරීමේ බලශක්ති භාවිතය විශ්ලේෂණය කරමින් පවතී. ස්වයංක්‍රීය වාර්තාකරණ යාන්ත්‍රණය තුළින් වාර්තා කළ පළමුවැන්නෙන් 35% ක් පමණ වූ තොගය 2019 අවසන් වන විට අපේක්ෂිත කුටුම්භ වෙත ළඟා විය.

**කාර්යක්ෂම විදුලි පංකා**

අනිවාර්ය ලේබල් කිරීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන අතර අකාර්යක්ෂම විදුලි පංකා රටට ආනයනය කිරීම දැන් තහනම් කර ඇත. උපකරණ සමීක්ෂණයේ පූර්ව පරීක්ෂණ අදියර ප්‍රතිඵල වලින් පෙනී යන්නේ පැරණි විදුලි පංකා විශාල ප්‍රමාණයක් රටේ බොහෝ නිවාසවල ක්‍රියාත්මක වන බවයි. නිවාස 6,357 ක නියැදියක් සම්බන්ධ නිවාස පිළිබඳ දිවයින පුරා කරන ලද සමීක්ෂණයක දත්ත විශ්ලේෂණය කිරීමෙන් පසුව මෙම පැරණි පංකා තොගය ප්‍රතිස්ථාපනය කිරීම ඉලක්ක කරගත් වැඩසටහනක් ක්‍රියාත්මක වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 අග භාගයේදී පවත්වන ලද ගෘහස්ථ විදුලි උපකරණ සමීක්ෂණය නමින් නම් කරන ලද මෙම සමීක්ෂණය මගින් සියලු විදුලි උපකරණ වර්ග, වයස, විනිවිද යාම සහ භාවිතා කරන කාලය, ඉවුම් පිහුම් ශක්තිය පිළිබඳ තොරතුරු සහ බලශක්ති සහ බලශක්ති නොවන වෙළඳ භාණ්ඩ සඳහා වන අනෙකුත් ගෘහ වියදම් පිළිබඳ විශාල දත්ත ප්‍රමාණයක් ජනනය කරන ලදී. මෙම සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය ළඟදීම අවසන් කිරීමට අපේක්ෂා කරන අතර ගෘහස්ථ අංශයේ ඉල්ලුම තක්සේරු කිරීම සඳහා වටිනා පර්යේෂණ දත්ත සමුදායක් සපයයි.

**හරිත ගොඩනැගිලි**

ගොඩනැගිලි ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් කෙටුම්පත් කරමින් පවතී.

**සුහුරු නිවාස**

සූර්ය වහල වැඩපිළිවෙල පුළුල් ලෙස පිළිගැනීමෙන් බලාපොරොත්තු වූවාට වඩා බොහෝ කලකට පෙර වැඩසටහනේ ඉලක්කය සාක්ෂාත් විය. කෙසේ වෙතත්, සුහුරු නිවාස සම්බන්ධ වෙනත් අංශ අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීය.

**ජව සාධක වැඩි දියුණු කිරීම**

ජව සාධක නිවැරදි කිරීමේ උපකරණවල ප්‍රශස්ත මට්ටම පිළිබඳ සීමිත අධ්‍යයනයක් සිදු කරන ලදී.

බලශක්ති ඉතිරිකිරීම් (kWh) සහ ඉල්ලුම් අඩුකිරීම් (MW) පිළිබඳ ආසන්න වශයෙන් ඇස්තමේන්තු කිරීමෙන් පෙන්නුම් කරන්නේ 2020 වන විට මෙම වැඩසටහනට ගිගාවොට් පැය 1,104 ක් ඉතිරි කර ගත හැකි අතර වී හරහා උත්පාදනය පුළුල් කිරීමේ අවශ්‍යතාවය මෙගාවොට් 417 කින් අඩු වන බවයි.

# ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාකාරකම්

## බලශක්ති අධ්‍යාපන වැඩසටහන

තිරසාර බලශක්තිය පිළිබඳ සංකල්ප හා භාවිතයන් දිගු කාලීනව රඳවා තබා ගැනීම සඳහා විශාල දැනුමක් ඇති කිරීමට අවශ්‍ය වේ. කාර්යක්ෂමව බලශක්තිය භාවිතා කිරීම පිළිබඳ ප්‍රචාරය කිරීමේදී පාසල් දරුවන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන නමුත්, තිරසාර බලශක්තියේ නව අවස්ථා පිළිබඳව සමාජය දැනුවත් කිරීමේ ප්‍රමාදය තවදුරටත් වැඩිවෙමින් පවතී. මේ සඳහා පාසල් දරුවන්ට කළ හැකි සේවාව හඳුනාගත් සුනිත්‍ය බලශක්ති අධිකාරිය, බලශක්ති අධ්‍යාපන වැඩසටහන හඳුන්වා දුන් අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් පාසල් බලශක්ති සමාජය පිහිටුවීම සිදු කරන ලදී.

2015 සිට පාසල් බලශක්ති සමාජ පවත්වා ඇති අතර එය දිවයින පුරා පාසල්වල පිහිටුවා ඇත. අතීත අත්දැකීම් මත පදනම්ව වැඩසටහන වැඩිදියුණු කිරීම සඳහා, සමාලෝචනය කර, නවීකරණය කරන ලද වැඩසටහනක් 2019 දී ක්‍රියාත්මක කරන ලදී. පළාත් 9 හි අදාළ පාසල්වල විද්‍යා ගුරුවරුන් පුහුණු කිරීම සඳහා තෝරාගෙන ඇති අතර ඔවුන් විසින් පාසල් බලශක්ති සමාජවල වගකීම භාරගෙන කටයුතු ඉදිරියට කරගෙන යනු ඇත. මෙම වැඩසටහන යටතේ 2019 දී ගුරුවරුන් 1,250 ක් පුහුණු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පළාත් නවයේ බලශක්ති සමාජ 700 ක් පිහිටුවා නැවත ලියාපදිංචි කරන ලදී.







ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද 'රට වෙනුවෙන් එකට සිටිමු' වැඩසටහනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සම්බන්ධ විය. එහිදී, මොණරාගල දිස්ත්‍රික්කයේ පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් 2019 ජූලි 02 සිට 05 වන දින දක්වා පවත්වන ලදී.

## දැනුවත් කිරීමේ වැඩසටහන්

- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ වැදගත්කම සහ බලශක්ති සංරක්ෂණ උපදෙස් ලබාදීම සඳහා පළාත් මාධ්‍යවේදීන්ට අවස්ථාවන් ලබා දෙන ලදී. එය පැවැත්වූයේ කෑගල්ල, නුවරඑළිය සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි ය.
- කුඩා ජල විදුලි ව්‍යාපෘතිවල වැදගත්කම සහ එවැනි ව්‍යාපෘති සඳහා තාවකාලික අනුමැතිය ලබා දීමේදී අනුගමනය කළ යුතු නීති රීති පිළිබඳව රජයේ නිලධාරීන් දැනුවත් කරන ලදී.
- ගම්පහ සියනෑ ගුරු පුහුණු පාසලේ පැවති බාලදක්ෂ ජම්බෝරිය සඳහා සහභාගී වීම. බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවීණතා ලාංඡනය පිළිබඳව බාලදක්ෂයින් 2,500 කට අධික පිරිසක් දැනුවත් කරන ලදී.
- SLSEA විසින් නිතිපතා සිදු කරනු ලබන සිදුවීම් පිළිබඳව පාසල් හා විශ්ව විද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කාර්තුමය සඟරාවක් වන 'සංරක්ෂා' ප්‍රකාශයට පත් කරන ලද අතර ඒවා බලශක්ති අංශයේ ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීම සිදු කරයි.



# ජාත්‍යන්තර මූල්‍ය ආයතන අරමුදල් සම්බන්ධ ව්‍යාපෘති

GHG අඩු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය වැඩි කිරීම සඳහා පැරිස් සම්මුතිය විසින් නියම කර ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වසර ගණනාවක් තිස්සේ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ සම්බන්ධ වී ඇත. පුනර්ජනනීය බලශක්ති සම්පත් ගවේෂණය කිරීම සඳහා තාක්ෂණික සහාය, පුහුණුව සහ දැනුම හුවමාරු කිරීමේ අවස්ථා, අරමුදල් සහ සම්පත් බලමුලු ගැන්වීම මෙන්ම පර්යේෂණ හා සංවර්ධන සහාය ද එම ආයතන විසින් අධිකාරියට ලබා දේ. 2019 දී සුනිත්‍ය බලශක්ති අධිකාරිය අවධානය යොමු කල ව්‍යාපෘති තුනකි. එනම් පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම, විදුලි උත්පාදනය සහ CoP21 පැරිස් ගිවිසුම සඳහා වන සූදානමයි. මෙම ගිවිසුම මගින් විමෝචන අඩු කිරීම, අධීක්ෂණය, වාර්තා කිරීම සහ විස්තාරණ වාර්තාකරණ පද්ධතියක් හරහා විමෝචන අඩුකිරීම් සත්‍යාපනය කිරීම සඳහා සූදානම් කිරීම සිදු කරයි.

### විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට සහාය වීම

**හවුල්කරුවන්:** CEB, LECO, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB)

**අරමුදල් සපයන රට:** ජපානය

**ආධාර දෙන ආයතනය:** ආසියානු සංවර්ධන බැංකුව

**අරමුණු:**

- හුදකලා වූ කුඩා දූපත් සහ ග්‍රාමීය ප්‍රජාවන් සඳහා ඵලදායී බලශක්ති භාවිතයන් උදෙසා සහාය වීම
- ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ජීවනෝපායන් වැඩි දියුණු කිරීම,

**ස්ථානය:** උතුරු පළාතේ යාපනය ප්‍රදේශය
(නයිනතිව්, ඇනලතිව් සහ ඩෙල්ෆ්ට්ස්)

**කාරයයන්:**

I. විදුලි උපකරණ ආරක්ෂිතව භාවිතා කිරීම පිළිබඳ පුහුණුව
II. විදුලි ප්‍රවේශය සමඟ මතුවන ආදායම් අවස්ථාවන් ඵලදායී ලෙස භාවිතා කිරීම පිළිබඳ පුහුණුව
III. නඩත්තු කිරීම, දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති සහ වෙනත් පහසුකම්වල සේවා නියුක්තිය වැඩි කිරීම සහ
IV. අතිරේක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

### ව්‍යාපෘති ප්‍රතිඵල

උපදේශකවරුන් විසින් මූලික තොරතුරු ලබා ගැනීමේ ක්ෂේත්‍ර චාරිකාව නිම කිරීමත් සමඟ මෙම ව්‍යාපෘතිය වර්ෂය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අරමුණු හා ව්‍යාපෘති අරමුණු වලට අනුකූලව ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුදුසු ප්‍රජාවන් හඳුනා ගැනීමට සමාජ ආර්ථික සමීක්ෂණ නියමු පරීක්ෂණයක් සම්පූර්ණ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය හරහා විශේෂයෙන් ඉලක්ක කරන්නේ ප්‍රමාණවත් බලශක්ති සැපයුමක් නොමැති හුදකලා දූපත් වන අතර ඔවුන්ගේ බලශක්ති අභියෝගයන්ට මුහුණ දීමයි. ඊට අමතරව, පුනර්ජනනීය බලශක්ති සම්පත් හා ඒවායේ ආර්ථික ප්‍රතිලාභ උපයෝගී කර ගැනීමේ අවස්ථා සහ ප්‍රතිලාභ පිළිබඳව ප්‍රජාවන් දැනුවත් කිරීමයි.

සමාලෝචන වර්ෂය තුළ ආරම්භක වාර්තාව සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කරන ලද අතර නිවැසියන්ගේ අවශ්‍යතා සහ නව විදුලි යටිතල පහසුකම් පිළිබඳ ඔවුන්ගේ අපේක්ෂාවන් පිළිබඳ මූලික අවබෝධය ලබා ගන්නා ලදී.

මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රජාවන්ට ආර්ථික ප්‍රතිලාභ සහ විභවයන් හඳුනා ගැනීම අරමුණු කරගත් පළමු හා දෙවන ආදායම් උත්පාදනය කිරීමේ අවස්ථා සිතියම්ගත කිරීමේ වැඩමුළු පැවැත්විණි. ඉන්පසු නියමු ප්‍රජා රැස්වීම් උපදේශන ද අවසන් කරන ලදී.

### බලශක්ති උත්පාදනය හා අවසන් භාවිතය අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ව්‍යාපෘතිය (NAMA ව්‍යාපෘතිය)

**හවුල්කරුවන්:** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය (CCS).

**ආධාර දෙන ආයතනය:** UNDP/ GEF

**අරමුණු:**

ශ්‍රී ලංකා රජයේ GHG අවම කිරීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා දරන ප්‍රයත්නයට සහාය වීම සඳහා බලශක්ති උත්පාදනය හා අවසන් භාවිත අංශයන්හි සුදුසු දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාමාර්ගයන්ට සහාය වීම.

**කාලය:** 2015 ජූලි - 2019 දෙසැම්බර්
මෙම ව්‍යාපෘතිය 2019 දී සාර්ථකව අවසන් කරන ලද අතර බලශක්ති උත්පාදනය හා අවසන් භාවිත අංශයන්හි ඉලක්කගත නාම 3 ක් සමඟ එහි බලශක්ති හා GHG විමෝචන අඩු කිරීමේ ඉලක්ක සපුරා ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී බැටරි ආචයනය සහිත සූර්ය බල පද්ධති ස්ථාපනය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර එමගින් පොසිල ඉන්ධන මත පදනම් වූ විදුලි උත්පාදනය අඩු කිරීමෙන් විමෝචන උත්පාදනය අඩු වේ.

GHG විමෝචනය අඩු කළ හැකි අංශ හඳුනාගෙන ඇති මෙම ව්‍යාපෘතිය මගින් විදුලිබල ඉතිරිකිරීම් තුළින් අඩු විමෝචනයක් ජනනය කරන තේ කර්මාන්තශාලා ඉලක්ක කර ගන්නා ලදී. ඉහළ GHG විමෝචන බලශක්ති උත්පාදනයෙන් සංක්‍රමණය වීම තවදුරටත් දිරිගැන්වීමේ මාධ්‍යයක් ලෙස සහ වායු විමෝචන අඩු කිරීම සඳහා LPG භාවිතය අඩු කිරීමට, ජීව වායුව නිපදවීම කෙරෙහි අවධානය යොමු කරයි. ඒ සඳහා ජීව වායුජනක (8 සිට 15 $m^3$ දක්වා ප්‍රමාණයන්) සඳහා ආයෝජනයන් සිදු කරන ලදී.

### ව්‍යාපෘති ප්‍රතිඵල

**GHG අඩු කිරීම**

- ඉලක්කගත GHG විමෝචන අඩුකිරීම් වලින් 79% ක් (12,766 $tCO_2eq$) සහ ඉලක්කගත බලශක්ති ඉතිරිකිරීම් වලින් 93% ක් (69,983 GJ) මෙම ව්‍යාපෘතිය තුළින් අත්කර ගෙන ඇත.
  - බැටරි ආචයනය සහිත සූර්ය බල පද්ධති - 101 $tCO_2eq$ (23%)
  - ඉහළ කාර්යක්ෂමතා මෝටර (HEMs) සහ විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFDs) - 4,355 $tCO_2eq$ (100%)
  - ජීව වායුජනක - 8,309 $tCO_2eq$ (73%)

# ජාත්‍යන්තර මූල්‍ය ආයතන අරමුදල් සම්බන්ධ ව්‍යාපෘති

**පුනර්ජනනීය බලශක්ති දත්ත ග්‍රහණය කර වාර්තා කිරීම**

- මෙම ව්‍යාපෘතිය මගින් වෙබ් අඩවි පදනම් කරගත් යෙදුමක් වන EnerGIS සංවර්ධනය කරන ලද අතර එය කළමනාකරණය කරනු ලබන්නේ SLSEA විසිනි. එය සම්මත MRV පද්ධති භාවිතා කරන අතර පළාත් නිලධාරීන් සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සහ අවසන් පරිශීලක පරිභෝජනයන් ග්‍රහණය කර වාර්තාගත කිරීම සඳහා ජාතික හා පළාත් බලශක්තිය සහ GHG විමෝචන මූලික ලේඛන සමඟ සම්බන්ධ වේ.
- MACC විශ්ලේෂණය (ඌන ආන්තික පිරිවැය වක්‍රය) සහ බහු නිර්ණායක විශ්ලේෂණයන්හි ඒකාබද්ධ ප්‍රතිඵල භාවිතා කරමින් SLSEA සහ CCS ඇතුළු බලශක්ති අංශයේ පාර්ශවකරුවන්ගේ බලශක්ති උත්පාදනය හා අවසන් භාවිත අංශයන්හි ප්‍රමුඛ ජාතික යෝග්‍යතා අවම කිරීමේ ක්‍රියාමාර්ග (NAMA) හඳුනාගෙන නිර්මාණය කර ඇත.

**තාක්ෂණික සහාය සහ පුහුණුව**

- තේ වතු සමාගම් කිහිපයක්, ජීව වායු පද්ධති සවිකරන්නන්, සූර්ය පද්ධති ස්ථාපකයන් සහ පළාත් මට්ටමේ නිලධාරීන් සහ අධීක්ෂණ නිලධාරීන් ඇතුළු පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතන ඉහත සඳහන් NAMA වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ශ්‍රී ලංකාව තුල ස්වේච්ඡාවෙන් අවම කිරීමට බලාපොරොත්තුවන ඉලක්ක සඳහා NAMA දායක වන අතර පුනර්ජනනීය බලශක්තිය හා අවසන් බලශක්ති භාවිත අංශයන්හි NAMA ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අත්දැකීම් සහ විශ්වාසයන් මෙම ආයතනවලට ලබා දී ඇත.
- NAMA ව්‍යාපෘති සැකසුම් ක්‍රියාපටිපාටිය සඳහා ආයතනික රාමුවක්, ස්ථාපිත ලේඛනයක් සහ MRV රාමුවක් හරහා සත්‍ය ලෙස GHG විමෝචනය අඩු කිරීම ගණනය කිරීමට අපේක්ෂා කරයි. මෙය නිවැරදිව මැනීම සහ ගණනය කිරීම සඳහා මෙවලම් සහ විශේෂඥ දැනුම ලබා දී ඇත. පළාත් මට්ටමේ පිරිස් සහ ක්ෂේත්‍ර නිලධාරීන්, සූර්ය පද්ධති සවිකරන්නන් සහ ජීව වායුව පිළිබඳ විච්ශේෂඥයින් මෙන්ම CCS නිලධාරීන් හරහා අවශ්‍ය විශේෂඥ දැනුම ලබා ගත හැකිය.

## විදුලි ත්‍රිරෝද නියමු ව්‍යාපෘතිය

බලශක්ති සම්පතක් ලෙස පොසිල ඉන්ධන ලබා ගන්නා විදුලි ත්‍රිරෝද නියමු ව්‍යාපෘතිය, ඉල්ලුමට සමානව නොතිබීම හේතුවෙන් පිරිහෙමින් පවතී. නව තෙල් සොයාගැනීම් සහ පරිභෝජනය අතර පුළුල් වන පරතරය සහ ලෝකයේ ඉහළම තෙල් නිෂ්පාදනය කරා ළඟා වීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ ප්‍රවාහන අංශයෙන් වැඩි වන ඉල්ලුමයි. එය වායු දූෂණයට සැලකිය යුතු දායකත්වයක් සපයයි.

ශ්‍රී ලංකාවේ තත්වයද ඊට වෙනස් නොවේ. ශ්‍රී ලංකාවේ දළ වශයෙන් ත්‍රිරෝද රථ මිලියනයක් ඇති බවට ගණන් බලා තිබේ. මෙම ත්‍රිරෝද රථ බොහෝ විට ක්‍රියාත්මක වන්නේ 4 සහ 2- අභ්‍යන්තර දහන එන්ජින් සමඟ වන අතර එහිදී පිස්ටන් බලය සම්ප්‍රේෂණය කරන්නේ දඟරකඳ (crankshaft) භ්‍රමණය කිරීමෙනි.

මේවා සාමාන්‍යයෙන් ඩීසල් මගින් බල ගැන්වෙන අතර වැඩි හරිතාගාර වායු විමෝචන (GHG විමෝචන) හේතුවෙන් විමෝචන පරීක්ෂණ සමත් වීම වඩාත් අපහසු වේ. ඒවා නඩත්තු කිරීමේ පිරිවැය අධිකය. ත්‍රිරෝද රථ ආනයනය සීමා කිරීම පිළිබඳව ද රජය සලකා බලයි.

අනෙක් අතට, ඊ-ට්‍රයික් සඳහා එන්ජින් සේවාවක් හෝ විමෝචන පරීක්ෂණයක් අවශ්‍ය නොවන අතර නඩත්තු වියදම් ශුන්‍ය වන අතර එහි මූල්‍යමය ලාභය වසරකට ඩොලර් 1,000 ක් පමණ වේ. කොරියානු බලශක්ති ඒජන්සිය විසින් පරිත්‍යාග කරන ලද ත්‍රිරෝද රථ පහක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලබාගෙන ඇති අතර ඒවා ප්‍රදර්ශන ව්‍යාපෘතියක් ලෙස BMICH හි ක්‍රියාත්මක වේ.

මෙම ඊ-ට්‍රයික් ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ මාර්ගවල ත්‍රිරෝද රථ අධික පිරිවැය මෙන්ම ඉහළ GHG විමෝචනයට විසඳුමක් වනු ඇත.





# ජෛව ස්කන්ධ

## 43.5 MW

## ව්‍යාපෘති සංඛ්‍යාව

## 12

බලශක්ති සම්පත් සිතියම්ගත කිරීමේ වැඩසටහන යටතේ කෘෂිකාර්මික අපද්‍රව්‍ය වලින් සහ ඩෙන්ඩ්‍රෝ ලෙස උත්පාදනය කළ හැකි ඉහළ විභව බලශක්ති ප්‍රභවයක් ලෙස ජෛව ස්කන්ධ ගවේෂණය කෙරේ.





# මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති අංශයේ ස්ථාවර වර්ධනයක් සහතික කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පුනර්ජනනීය බලශක්ති අංශයේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන්ගේ නිපුණතා ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ආයෝජනය කර ඇත. අධිකාරිය විසින් තාක්ෂණ හුවමාරුව, දැනුම හුවමාරුව, ධාරිතා සංවර්ධනය සහ තිරසාර බලශක්ති ක්ෂේත්‍රයේ නිරාවරණය හා පුහුණුව සඳහා අවස්ථා නිර්මාණය කර ඇත. අධිකාරියේ මානව සම්පත් සංවර්ධනයෙහි ප්‍රධාන ප්‍රමුඛතාවයන්ගෙන් එකක් වන ශ්‍රී ලාංකාවේ තිරසාර බලශක්ති ව්‍යාපෘති ඉහළ නැංවීමට ඉමහත් දායකත්වයක් ලබා දී ඇත.

## අභ්‍යන්තර මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ ගෝලීය තිරසාර බලශක්ති සංවර්ධන ප්‍රවණතාවන්ට නිරාවරණය වීම වැඩි කිරීම අරමුණු කරගත් වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

ඉංජිනේරුවන්ට සහ ව්‍යාපෘති සැලසුම්කරුවන්ට ලබා දෙන විදේශීය පුහුණු අවස්ථා මගින් ශ්‍රී ලංකාව තුළ උපරිම ප්‍රතිලාභ සහිතව ක්‍රියාත්මක කළ හැකි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කළේය.

සූර්ය හා සුළං බලශක්තිය, මුහුදාශ්‍රිත සුළං බලශක්තිය, හරිත ගොඩනැගිලි, ඉල්ලුමට සරිලන බලශක්ති කාර්යක්ෂමතාව සහ ව්‍යාපෘති මූල්‍ය බලශක්ති කොන්ත්‍රාත්තු සඳහා විදේශීය පුහුණුව ලබා දී ඇත. දේශීය පුහුණු වැඩසටහන් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි, උසස් මෘදුකාංග කුසලතා සහ අභ්‍යන්තර විගණන සැලසුම්කරණය යන අංශයන්ට අදාලව පුහුණුව ලබා දී ඇත.



මුහුදාශ්‍රිත සුළං බලශක්ති වැඩසටහන, එක්සත් රාජධානිය




දකුණු-දකුණු දැනුම හුවමාරු වැඩසටහන - කොරියානු සෝල් නුවර බලශක්ති කාර්යක්ෂම හා හරිත ගොඩනැගිලි පිළිබඳ



ඉන්දියානු ජාතික සුළං බලශක්ති ආයතනය- සුළං සම්පත් තක්සේරු කිරීම සහ සුළං බලාගාර උද්‍යානය සැලසුම් කිරීම

# මානව සම්පත් සංවර්ධනය

## අපගේ කාර්යය මණ්ඩලය

ජාතික තිරසාර බලශක්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ දායකත්වය පිළිබඳව අධිකාරිය මහත් ආඩම්බරයට පත්වේ.

අපගේ කාර්ය මණ්ඩල සංයුතිය මගින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීම්, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, තක්සේරු කිරීම, පර්යේෂණ සහ අවශ්‍ය බිම් මට්ටමේ සහයන් ජාත්‍යන්තර හා දේශීය තිරසාර බලශක්ති ආයෝජකයින්ට ලබා ගත හැකි බව සහතික කරයි.

SLSEA කාර්ය මණ්ඩල සටහන.






# ක්‍රියාකාරී සැලැස්ම 2020

හරිතාගාර වායු (GHG) විමෝචන අවම කිරීමේ උත්සාහයන් එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතියට (UNFCCC) අනුව අනුමත කර ඇති අතර එහිදී 2020-2030 කාලය සඳහා NDC ඉලක්ක ප්‍රකාශයට පත් කර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිහිටුවා ඇති තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සමඟ රටේ සංවර්ධන වැඩසටහන් පෙළගැස්වීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටී. තිරසාර බලශක්ති ඉලක්ක 2030 ළඟා කර ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් තුළ පැහැදිලි සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2020 වසරේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම අපගේ අරමුණයි.

සුනිත්‍ය බලශක්ති අධිකාරිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ එක්ව එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ සම්මුතියට අනුකූලව සාක්ෂාත් කර ගැනීමට අරමුණු කරගත් ජාතික පුනර්ජනනීය බලශක්ති උපාය මාර්ගයක් සකස් කර තිබේ. දිවයින පුරා සිටින සියලුම පුරවැසියන්ට විශ්වාසදායක ලෙස, පිරිසිදු බලශක්තියක් දැරිය හැකි මිලකට ලබා දීමට රජය අරමුණු කරයි.

තිරසාර බලශක්ති සංවර්ධනය සඳහා වගකිව යුතු ජාතික ආයතනය ලෙස, බලශක්ති සම්පත් විවිධාංගීකරණය කිරීම හා බලශක්ති කාර්යක්ෂමතාව, සංරක්ෂණය, තිරසාරත්වය කෙරෙහි හිතකර ප්‍රතිපත්ති, බලශක්ති තොරතුරු කළමනාකරණය සහ තිරසාර බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන කිරීම යන ප්‍රධාන  ප්‍රමුඛතා වැඩිදියුණු කිරීම  SLSEA හි අරමුණ වේ. මේ සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සිය තිරසාර බලශක්ති ඉලක්ක ලෙස 2020 වන විට ළඟා කර ගත හැකි ඉලක්ක පහතින් දක්වා ඇති පරිදි හඳුනාගෙන ඇත.

- 2020 වන විට 20% ක විදුලි ප්‍රමාණයක් පුනර්ජනනීය බලශක්තියක් ලබා ගැනීමෙන් උත්පාදනය කිරීමට ආනයනය කරන ලද පොසිල ඉන්ධන වෙනුවට ජාතික විදුලි ධාරිතාවෙන් 20% ක් දක්වා උත්පාදනය කළ හැකි නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට යොමු වීම .
- මුළු බලශක්ති භාවිතය 10% කින් අඩු කිරීම

  2020 වන විට බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණ (EEI&C) පියවර වැඩි කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

බලශක්ති සුරක්ෂිතතාව සහතික කරන අතරම මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

- පුනර්ජනනීය බලශක්ති භාවිතයේ සියලුම ආකාර වැඩි දියුණු කිරීම
- සියලු බලශක්ති වටිනාකම් දාමයන් හරහා බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය වැඩි දියුණු කිරීම
- රටේ බලශක්ති පද්ධතිය පොසිල ඉන්ධන පදනමේ සිට තිරසාර බලශක්ති පදනමක් බවට පරිවර්තනය කිරීම දිරිගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම
- රටේ තිරසාර බලශක්ති ආයෝජන සඳහා හිතකර වාතාවරණයක් ඇති කිරීම
- නව තිරසාර බලශක්ති තාක්ෂණයන් හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම
- තිරසාර ජීවන රටාවන්, පුරුදු සහ වටපිටාවක් ඇති කිරීමට මහජනයා සම්බන්ධ කර ගැනීම

| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 1,544,949 | 1,544,949 |
| ලේකම් - පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය - ඌව/වයඹ - NAMA ව්‍යාපෘතිය | 1,391,750 | 522,250 |
| ප්‍රධාන ලේකම් - දකුණු හා නැගෙනහිර පළාත් සභා - NAMA ව්‍යාපෘතිය | 2,880,050 | 1,955,680 |
| අත්තිකාරම් - මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් - NAMA ව්‍යාපෘතිය | 2,231,265 | 2,214,750 |
| වෙනත් | 6,785,378 | 6,125,168 |
| **එකතුව** | 20,525,791 | 17,203,163 |
| **චක්‍රීය අරමුදල** | | |
| ආපදා ණය | 13,100,565 | 13,077,507 |
| විශේෂ අත්තිකාරම් | 5,385 | 108,185 |
| උත්සව අත්තිකාරම් | 41,989 | 31,989 |
| ගංවතුර ණය | 319,645 | 804,796 |
| | 13,467,584 | 14,022,477 |
| **වෙනත් ජංගම වත්කම්වල එකතුව** | 33,993,375 | 31,225,640 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## සටහන 16 - මුදල් හා මුදල්වලට සමාන දෑ

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | 2019<br>රු. | 2018<br>ප්‍රතිප්‍රකාශිත<br>රු. |
|---|---|---|
| ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුම - 100610493406 | 180,115,763 | 173,410,145 |
| මහජන බැංකු ජංගම ගිණුම - 078100188503576 | 4,227,731 | 25,214,869 |
| මහජන බැංකු ජංගම ගිණුම - 078100278503576 | 4,620,072 | 4,620,071 |
| ලංකා බැංකු ජංගම ගිණුම - 8002630 | 2,697,932 | 933,764 |
| ලංකා බැංකු ජංගම ගිණුම - 74944408 | 48,209,002 | 76,202,054 |
| ලංකා බැංකු ඉතිරි කිරීමේ ගිණුම- 75803419 | 185,208,026 | 134,548,641 |
| ලංකා බැංකු ජංගම ගිණුම - 80595356 | 12,235,101 | 37,878,950 |
| එකතුව | 437,313,627 | 452,808,494 |

## සටහන 17 - සමුච්චිත අරමුදල

2007 සැප්තැම්බර් 30 දිනට බලශක්ති සංරක්ෂණ අරමුදලෙහි පැවැති සමුච්චිත අරමුදල 2007 ඔක්තෝබර් 01 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත මාරු කරන ලදි. එම අරමුදලේ සංයුතිය පහත පරිදි වේ:

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | 2019<br>රු. | 2018<br>ප්‍රතිප්‍රකාශිත<br>රු. |
|---|---|---|
| 2007 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත අරමුදල | 7,076,392 | 7,076,392 |
| ආරම්භක ප්‍රාග්ධනය | 5,000,000 | 5,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 5,761,145 | 5,761,145 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙන් ප්‍රාග්ධන ප්‍රදාන | 3,612,560 | 3,612,560 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලද ආධාර ප්‍රදාන | 650,239 | 650,239 |
| **එකතුව** | 22,100,336 | 22,100,336 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## සටහන 18 - විලම්බිත ප්‍රදාන

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | | | 2019<br>රු. | 2018<br>ප්‍රතිප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන 2008 | | | 33,770,435 | 33,770,435 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2009 | | | 11,955,533 | 11,955,533 |
| විදේශ ප්‍රදාන 2009 | - | ජපාන | 24,165,380 | 24,165,380 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2010 | - | හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය | 46,693,991 | 46,693,991 |
| | - | ක්‍රමක්ෂය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | 10,646,819 | 10,646,819 |
| විදේශ ප්‍රදාන 2010 | - | ජපාන | 11,419,569 | 11,419,569 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2011 | - | ඉඳුරාන සුළු ජල බලශක්ති ව්‍යාපෘතිය | 15,523,945 | 15,523,945 |
| | - | ක්‍රමක්ෂය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | 68,798,341 | 68,798,341 |
| විදේශ ප්‍රදාන 2011 | - | ජපාන | 1,155,016,402 | 1,155,016,402 |
| | - | කොරියානු | 191,097,075 | 191,097,075 |
| විලම්බිත අරමුදල 2012 | - | ආසියානු සංවර්ධන බැංකුව | 15,082,346 | 15,082,346 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2012 | | | 23,581,236 | 23,581,236 |
| විලම්බිත අරමුදල 2013 | - | ආසියානු සංවර්ධන බැංකුව | 43,416,071 | 43,416,071 |
| විලම්බිත අරමුදල 2013 | - | කොරියානු - KOICA | 35,662 | 35,662 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2013 | - | FARDF | 41,873,961 | 41,873,961 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2014 | | | 20,487,827 | 20,487,827 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2015 | | | 14,655,015 | 14,655,015 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2016 | | | 17,855,251 | 17,855,251 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2017 | | | 19,806,619 | 19,806,619 |
| අඩු කළා: | | | | |
| | - | ගතවූ වසරවල විලම්බිත ආදායම | (1,342,034,511) | (957,038,514) |
| | - | වසර සඳහා වූ විලම්බිත ආදායම | (43,350,681) | (350,329,330) |
| **එකතුව** | | | 380,496,286 | 423,846,967 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## සටහන 19 - වෙනත් ගෙවිය යුතු දෑ

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | 2019<br>රු. | 2018<br>ප්‍රතිප්‍රකාශිත<br>රු. |
|---|---|---|
| ස්වීච් වීෂියා පාලන ගිණුම | 4,548,176 | 4,548,176 |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 500 | 500 |
| උපචිත වියදම් | 10,855,691 | 2,508,909 |
| ඉදිරිපත් නොකළ චෙක්පත් | 1,260,442 | 1,282,665 |
| පුනර්ජනනීය බලශක්ති - සූර්ය බලශක්ති ලියාපදිංචි ගාස්තු | 295,860 | 295,860 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 470,000 | 470,000 |
| විගණන ගාස්තු | 2,274,976 | 2,058,636 |
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | 1,922,152 | 3,782,610 |
| WHT ගෙවිය යුතු බදු | 379,602 | |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 7,675 | |
| ජීවා ශක්ති ඇසෝසියේට්ස් - සමීක්ෂණ ගාස්තු | 252,875 | 252,875 |
| ලංසු ලේඛනය | 20,000 | 5,000 |
| වෙනත් | 370 | |
| ගෙවිය යුතු වෙනත් අඩු කිරීම් | 47,323 | |
| **ණයහිමියෝ** | | |
| පුනර්ජනනීය බලශක්තිය - ඊ නෙට් සලූෂන්ස් (පෞද්.) සමාගම | 1,667,500 | 1,667,500 |
| බලශක්ති උපකරණ අත්පත් කරගැනීම | 326,025 | 326,025 |
| රඳවාගැනීම් | 2,249,488 | 3,168,918 |
| නාරාහේන්පිට ජාතික පොළ | 99,405 | 99,405 |
| කොන්ඩසිංහ ඉදිකිරීම් | 6,465,264 | |
| **විවිධ ණයහිමියෝ** | | |
| ශ්‍රී ලංකා රේගුව | 310,748 | 310,748 |
| සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සුභසාධක සංගමය | 442 | 442 |
| **ආපසු ගෙවන තැන්පතු** | | |
| ඊ නෙට් සලූෂන්ස් (පෞද්.) සමාගම | 10,000 | 10,000 |
| ඊ එන් එල් කන්සල්ටන්ට්ස් | 150,000 | 150,000 |
| සිග්මා ටෙක්නොලජීස් | 10,000 | 10,000 |
| සී/ස රේන්කෝ රිනීවබල් එනර්ජි (පෞද්.) සමාගම | 30,000 | 30,000 |
| විදුල්කා බලශක්ති ප්‍රදර්ශනය | 9,256 | 9,256 |
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 54,000 | 54,000 |
| ආපසු ගෙවන තැන්පතු - වාහන | 14,000 | 14,000 |
| ඒ ටී ඒ ඉන්ටර්නැෂනල් | 50,000 | 50,000 |
| විදුල්කා සම්මන්ත්‍රණය - Entertainment Ltd | 25,000 | 25,000 |
| **එකතුව** | 33,806,770 | 21,130,525 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

සටහන 20 - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | 2019 රු. | 2018 ප්‍රතිප්‍රකාශිත රු. |
|---|---|---|---|
| **2019.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය** | | | |
| ජංගම නොවන වත්කම් | | | - |
| **ජංගම වත්කම්** | | | |
| සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජංගම ගිණුම (FOA) - Energy plus ගොඩනැගිල්ල | | 48,678,878 | 48,678,878 |
| මුදල් හා මුදල් සමාන දෑ | | | |
| ජා.ඉ.බැ. ඉතුරුම් ගිණුම | | 180,115,763 | 173,410,145 |
| ලංකා බැංකු ඉතුරුම් ගිණුම | | 185,208,026 | 134,548,641 |
| | | 414,002,667 | 356,637,664 |
| සමුච්චිත අරමුදල | | 335,605,770 | 332,842,789 |
| වසර සඳහා වූ අතිරික්තය/හිඟය | | 35,297,205 | 2,762,982 |
| මුළු සමුච්චිත අරමුදල | | 370,902,975 | 335,605,771 |
| **ජංගම වගකීම්** | | | |
| සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජංගම ගිණුම (FOA) | | 43,099,692 | 16,368,808 |
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | | | 4,663,085 |
| **එකතුව** | | 414,002,667 | 356,637,664 |
| **ආදායම** | | | |
| ආදායම - බලශක්ති අරමුදල | 9 | 44,628,149 | 24,346,730 |
| **වියදම්** | | | |
| සම්පත් වෙනකිරීම හා සංවර්ධනය | | | 823,590 |
| පළාත් මට්ටමේ බලශක්ති වැඩසටහන | | | 3,326,188 |
| හම්බන්තොට පුනර්ජනනීය පරිශ්‍රය ක්‍රියාවට නැංවීම | | 7,276,625 | 5,348,808 |
| ඉඳුරාන පරිශ්‍රය ක්‍රියාවට නැංවීම | | | 5,392,059 |
| පුනරීන් බලශක්ති උද්‍යානය | | | 1,470,600 |
| ප්‍රමිතීන් හා නියාමනයන් හඳුන්වා දීම | | | 1,200,000 |
| බලශක්ති අධ්‍යාපන වැඩසටහන | | | 1,053,326 |
| ප්‍රවර්ධන වැඩසටහන | | 2,054,319 | 2,969,177 |
| | | 9,330,944 | 21,583,748 |
| **අතිරික්තය/හිඟය** | | 35,297,205 | 2,762,982 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

### සටහන 21 - ශ්‍රී ලංකා සුනිත්‍ය ඇපප අරමුදල

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | 2019<br>රු. | 2018<br>ප්‍රතිප්‍රකාශිත<br>රු. |
|---|---|---|
| **ආදායම** | | |
| පොලී ආදායම - ස්ථාවර තැන්පතු | 3,405,343 | 3,401,099 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 5,738,565 | 5,347,045 |
| **මුළු ආදායම** | 9,143,908 | 8,748,144 |
| **අඩුකළා:** | | |
| වියදම් | - | - |
| | | - |
| **මුළු වියදම්** | - | - |
| **ශුද්ධ අතිරික්තය/හිඟය** | 9,143,908 | 8,748,144 |

# ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } පීඕඊ/ඩී/එස්එල්එස්ඊඒ/එෆ්එස්/2019/46

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ජනවාරි 13 දින

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 07 හි දේපල පිරියත හා උපකරණ පිළිබඳවූ ප්‍රමිතියේ 92 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එහෙත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 340,629,707 ක්වූ දේපල පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 03 ප්‍රකාරව සංශෝධනය කර නැවත මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඳුරාන සරත්චන්ද්‍ර රාජකරුණා ජාත්‍යන්තර මධ්‍යස්ථානය සඳහා 2017 ජනවාරි 09 දින පරිත්‍යාගයක් වශයෙන් ලබාදී තිබුණු හෙක්ටයාර් 0.28 ක ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) ක්‍රමක්ෂේපිත විලම්භිත ප්‍රදාන ආදායම(Amortized Differed Grant Income) රු. 3,221,352 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අදායමක් ලෙස හඳුනා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම එම වටිනාකමින් අඩුවෙන්ද විලම්භිත ප්‍රදාන අදායම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඈ) ඉන්වොයිස් පත් දෙවරක් ගිණුම්ගත කිරීම නිසා ඇතිවූ දෝෂයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අදායම සහ බලශක්ති අරමුදල සඳහා ලැබියයුතු මුදල් රු. 1,005,550 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) වැඩ අවසන්කර තිබුණු ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියකට අදාළ උපකරණ සඳහා ගෙවාතිබුණු රු. 2,299,935 ක බදු කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ කිහිපයක සිට දක්වා තිබුණද එය සමාලෝචිත වර්ෂයේදී හෝ නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඊ) වෙනත් ජංගම වත්කම් යටතේ වර්ගකර ඇති වෙනත් අත්තිකාරම් ගිණුමට වැරදීමකින් රු. 301,918 ක් බැරකර තිබීම නිසා එම වටිනාකමින් අත්තිකාරම් ගිණුම් ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) පුනරීන් විදුලිබල ව්‍යාපෘතියට අදාලව උපදේශන සේවා සැපයීම් වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාල යට ගෙවනලද රු. 9,192,859 ක ගෙවීම් සඳහා වන වවුචර්පත් සහ උපයෝගී ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

2

# ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය

3

# ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව

ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

4

# ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද මෙම වාර්තාවේ 1.2 (ආ). (ඉ) ඡේදවල සඳහන් කරුණු හැර නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

5

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| **(අ) 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනත** | |
| 46 (3) වගන්තිය | සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩමක් වසර 30කට බදු ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරීම සඳහා 2015 සිට 2019 වර්ෂය දක්වා එකතුව රු. 48,678,878 ක් අධිකාරිය විසින් අරමුදලේ අරමුණු වලට පටහැනි ලෙස බලශක්ති අරමුදලේ ආයෝජන වලින් ඉවත් කරගෙන තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| II වන පරිච්ඡේදයේ 13.7 ඡේදය | වැඩ බැලීමේ තනතුරක් සඳහා නිලධාරියෙකු පත් කිරීමේ බලධාරියා විසින් පත් කර ඇත්තේ නම් මිස ඔහුට අතිරේක පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතු වුවත් අධිකාරිය විසින් එයින් බැහැරව වැඩබලන තනතුරු සඳහා 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය මැයි දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස එකතුව රු. 3,714,952 ක් ද, ඉන්ධන දීමනා ලෙස රු. 4,853,050 ක් ද, ප්‍රවාහන දීමනා වශයෙන් 2015 සිට 2019 වර්ෂයේ මැයි දක්වා රු. 5,020,000 ක් ද ගෙවා තිබුණු අතර මෙම මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් නැවත අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 454 | මෙකී රෙගුලාසිය ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. |

6

| | | |
|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 757(1) | සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් භෞතික සත්‍යාපනය කර එම වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 395 (ඇ) | අධිකාරිය විසින් පවත්වාගෙනයනු ලබන බැංකු ජංගම ගිණුම් 05 ට අදාලව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 396 (ඇ) | ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ වලංගු කාලසීමාව ඉක්මවූ රු. 1,260,442 ක චෙක්පත් සම්බන්ධයෙන් මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | එකතුව රු. 864,995,252 ක් වූ ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛනය චක්‍රලේඛයේ නියමයන්ට අනුව යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| **(ඉ)** | **2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| | (i) 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත අනුමත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ මාස 06 ක පමණ ප්‍රමාදයකින් පසුව 2020 සැප්තැම්බර් 08 දිනය. |
| | (ii) 9.9 වගන්තිය | අතිකාල වියදම පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 5.1.1 වගන්තිය | ආයතනයේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගෙන නොතිබුණි. |
| (ඊ) **1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | "ස්විච්-ඒෂියා" වැඩසටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7,334,354 ක මුදලින් රු. 3,135,202 ක්, චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හිදී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |
| (උ) **2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නොගැනෙන අධිකාරියේ ඉංජිනේරු තනතුර දරන නිලධාරීන් සඳහා 2016 අගෝස්තු මස සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු. 14,861,000ක මුදලක් වෘත්තීය දීමනා ලෙස අධිකාරිය විසින් ගෙවා තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

8

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

---

(අ) 2016 වර්ෂයේ දී පළාත් 09 වෙනුවෙන් අධ්‍යාපන කලාප වැඩ සටහන් සඳහා දැනුම කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු. 13,348,087 ක් අත්තිකාරම් ලබා දී තිබූ අතර එයින් පළාත් තුනක් සඳහා ලබා දී තිබූ රු. 3,246,466ක අත්තිකාරම් මුදල් 2019 දෙසැම්බර් 31 දින දක්වාම පියවා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ලැබිය යුතු අත්තිකාරම් යටතේ ඇතුලත් රු. 1,094,015 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාලයක් ඉදිරියට ගෙන එමින් පවතින අතර එම මුදල් අය කර ගැනීමට හෝ ඒ සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ගෙවීම් හා ණයහිමියන් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 2,953,225 ක් වර්ෂ 01 සිට 04 ක කාලයක සිට ද ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස දක්වා තිබූ රු. 277,256 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට ද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මෙම මුදල නිරවුල් කිරීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ප්‍රධාන ව්‍යාපෘති 04 ට අදාලව අයවැයගත වියදම රු. 207,400,000 ක් හා තත්‍ය වියදම රු. 131,129,145 ක් වූයෙන් මුළු ප්‍රතිපාදනයෙන් රු. 76,270,855 ක් එනම් සියයට 37 ක් ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) කොරියානු බලශක්ති නියෝජිත ආයතනය (KEA) හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක නියමු ව්‍යාපෘතියක් යටතේ ප්‍රදානයක් ලෙස අධිකාරිය වෙත ලැබුණු සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ත්‍රී රෝද රථ 04 ක් ක්‍රියාකිරීමේ නියෝජිත ආයතනය ලෙස බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව වෙත 2019 දෙසැම්බර් 13 දින භාරදී ඇති නමුත්, නියමු ව්‍යාපෘතියට අදාලව දත්ත එක්රැස් කරගැනීම සඳහා ගිවිසුමකට එලඹ නොතිබුණි. එසේම නියමු ව්‍යාපෘතියට අදාලව දත්ත එක්රැස් කරගැනීමක් හෝ පසු විපරමක්ද සිදුව නැති බැවින් ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට ඵලදායිව භාවිතාවී නොමැති බවට නිරීක්ෂණය විය.

(ඊ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට 2012 නොවැම්බර් මස RCL (Regional Centre for Lighting) මධ්‍යස්ථානයේ කළමනාකරණය සහ වත්කම් පවරා දී තිබුණ ද මෙම පවරාදීම නිසි පරිදි සිදුනොවීම හේතුවෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පදනමට අධිකාරිය විසින් ගෙවන ලද රු. 8,033,270 ක් වූ හිඟ බදු

9

තුලි 2020 ඔක්තෝබර් දක්වාම ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(උ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේ වාර්තාව අනුව 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා රු. 2,171,760 ක් අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට හෝ නිවැරදි කිරීමට මේ දක්වා අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඌ) නාගරික සංවර්ධන අධිකාරිය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය අතර ඇතිකර ගත් 2015 ජුනි 22 දිනැති අංක 631 දරන බදු ගිවිසුම අනුව වසර 30 ක කාලයක බදු පදනම යටතේ අධිකාරිය සඳහා 2015 වර්ෂයේ දී රු. 45,856,451 කට බත්තරමුල්ල ප්‍රදේශයෙන් පර්චස් 75 ක ඉඩමක් ලබා ගෙන තිබුණු අතර 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා රු. 23,290,653 ක වියදමක් දරා සැලසුම් සකස් කිරීම පමණක් සිදුකර තිබුණ නමුත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු. 7,956,800 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 12ක් ගත වී තිබුණද, මෙය නිම කිරීම සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ අලාභය පියවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඒ) "ස්විච් -ඒෂියා" වැඩ සටහන යටතේ ලැබී ඉතිරිව තිබූ රු. 4,548,176 ක් 2011 වර්ෂයේ සිට මහජන බැංකුවේ ජංගම ගිණුමකද, බලශක්ති අරමුදලට අදාල රු. 150,000,000 කට වැඩි මුදලක් වසර ගණනාවක සිට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක ද කිසිදු ඵලදායී ආයෝජනයක යොදවා ගැනීමෙන් තොරව තැන්පත් කර තිබුණි.

(ඔ) ඉඳුරාන ජාත්‍යන්තර ප්‍රවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂය සඳහා රු. 17,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ඉන් සියයට 45 ක් පමණක් එනම් රු. 7,594,466 ක් 2019 දෙසැම්බර් 31 දිනට වැයකර ඇති අතර සියයට 55 ක් එනම් රු. 9,405,534 ක් ව්‍යාපෘතිය සඳහා වැය කර නොතිබූ බැවින් ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති මුදල් අදාල කාලසීමාව තුල උපයෝජනය කර නැති බව නිරීක්ෂණය විය.

10

# ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව

(ඕ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් පරිගණකගත ගිණුම්කරන පද්ධතියක් මගින් ගිණුම් තැබීම ආරම්භකර ඇතිමුත් ඊට අදාලව පොදු පාලනයන්(General Controls) සහ යෙදවුම් පාලනයන්(Application Controls) ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

11

# 2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර

2021.01.27

විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය,

306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

උක්ත කරුණට අදාළව 2021.01.13 දින ඔබ විසින් එවන ලද විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

**1.මූල්‍ය ප්‍රකාශන**

**1.2. තත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) අප ආයතනය 2015 වර්ෂයට පෙර මිලදීගත් ස්ථාවර වත්කම් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින්, වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් භාවිතා කරනු ලබන දේපල පිරියත හා උපකරණවල හඳුනාගැනීම අපහසු බැවින් එය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට නොහැකි වුවත් ආයතනය සතු ස්ථාවර වත්කම් සියල්ල ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු සූදානම් කරමින් ඇත.

(ආ) රාජ්‍ය ආයතන ඉඩම් ප්‍රත්‍යාගණනය කළ යුත්තේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව පමණක් වන අතර ඉඳුරාන සරත්චන්ද්‍ර රාජකරුණා ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ ඉඩම අගයකර දෙන මෙන් කිහිප විටක් ඉල්ලීම් කළ ද ඔවුන් විසින් මේ වන තුරුත් තක්සේරු වාර්තාව ලබා නොදෙන ලදි.

(ඇ) ක්‍රමක්ෂේපිත විලම්භිත ප්‍රදාන ආදායම ගණනය කිරීමේ දී සිදුවූ වරද 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට බලාපොරොත්තුවේ.

(ඈ) ලැබිය යුතු ගිණුම් තුළ බලශක්ති අරමුදල සඳහා ලැබිය යුතු මුදල් ලෙස පෙන්වන ශේෂය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලදී නැවත ප්‍රතිශ්ඨාපනය කොට නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

1 | Page

# 2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර

(ඉ) මේ පිළිබද 2020 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු සුදානම් කර ඇත.

(ඊ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(උ) පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘතියට අදාලව උපදේශන සේවා සැපයීම වෙනුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයට ගෙවන ලද ගෙවීම් සඳහා ලදුපත් ඉක්මණින් අප අධිකාරියේ මූල්‍ය අංශයට ලබා දෙන ලෙස කොළඹ විශ්ව විද්‍යාලයෙන් ඉල්ලීමක් කර ඇත.

**2.වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳවාර්තාව**

(අ) ශ්‍රී ලංකා බලශක්ති අරමුදලේ අරමුණු අතර, විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම දේශිය සම්පත් විදුලි ජනනය සඳහා සංවර්ධනය කිරීම හා බලශක්ති කාර්යක්ෂමව භාවිතා කිරීමට ජනතාව පෙළගැස්වීම ප්‍රධාන වශයෙන් හැදින්විය හැක.

ඒ අනුව ජනතාවට ප්‍රායෝගික අත්දැකීමක් ලබා දීමෙන් ජනතාව වඩාත් වේගයෙන් ඒ කෙරෙහි යොමු කිරීමට පහසු බැවින් බත්තරමුල්ලේ, අපේ ගම ආසන්නයේ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන ගොඩනැගිල්ල “ Energy Plus” යන තේමාව යටතේ සැලසුම් කළ ගොඩනැගිල්ලකි. ජනතාවට බලශක්ති අරපිරිමැස්ම සහ අවම ස්වාභාවික සම්පත් භාවිතයෙන් විදුලිය අරපිරිමැස්මෙන් ගොඩනැගිලි නිර්මාණය කළ හැකි බවට පෙන්වන ප්‍රදර්ශක ගොඩනැගිල්ලකි. එය නිමා කර ජනතාවට ප්‍රායෝගිකව බලශක්ති සංරක්ෂණ ක්‍රම යොදා ගත හැකි ක්‍රමවේද සියසින් දැක ගත හැකි නිර්මාණයක් බැවින් “එය විගණන අංශය අරමුදලට පටහැනිව සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාලයක් නිර්මාණය කිරීම “ යනුවෙන් විගණනයේදී අර්ථ දැක්වීම ඉතාම කණගාටුවට කරුණකි. එබැවින් එහි සත්‍ය අධ්‍යනය කර නිවරදි දෙය වටහා ගැනීම කළ යුතු බව අවධාරනය කරමි.

අධිකාරි පනතේ ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රතිපාදන තිබෙන බැවින් අරමුදලේ ප්‍රතිපාදන වියදම් කළ හැක. “මෙම වියදම් සියල්ල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව සිදු කර ඇති බවද දන්වමි.”

තවද බලශක්ති අරමුදලෙන් මෙම ගොඩනැගිල්ල සඳහා වැය කර ඇති මුදල වන්නේ රු.48,678,878 ක් පමණි.

2 | Page

# 2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර

(ආ) වැඩ බැලීමේ තනතුරු සඳහා 2013 වසරේ නිලධාරීන් පත්කිරීම පිළිබඳව ඇතිවූ විගණන මතයට අනුව ඒ සඳහා පත්කිරීමේ බලධාරියා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා 22/09/2020 දින අධ්‍යක්ෂමණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙම ගැටළු විසදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විසින් පහත සඳහන් නියෝජිතයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් පත්කර ඇත.

1. සභාපති - නයනා නාථවිතාරණ මහත්මිය - අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභාව සහ පළාත් පාලන
2. සාමාජික - නිෂාද් උපේන්ද්‍ර මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
3. සමාජික - ඩී.පී. වික්‍රමසිංහ මහතා - අතිරේක ලේකම් (පාලන) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ඉහත අනුකමිටුව මගින් මේ පිළිබඳ වාර්තාවක් ලබාගැනීමට නියමිතය.

(ඇ) (i) වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව නව පරිගනක මෘදුකාංගය පවත්වා ගැනීමට කටයුතු සුදානම් කර ඇත.

(ii) වත්කම් භෞතික සත්‍යාපන කටයුතු නිමකර ඇත.

(iii) මාසික බැංකු සැසදුම් ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කර ඇත

(iv) මේ සඳහා ගණුදෙනු කරුවන් වෙත ලිපි යැවීමට කටයුතු යොදා ඇත.

(ඈ) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව පරිසනක මෘදුකාංග ගතකොට විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත.

(ඉ) (i) අප අධිකාරියේ ගිණුම්කරණ ක්‍රියාවලිය 2019 වර්ෂයේ දී පරිසනකගත කිරීම ආරම්භ කරන ලදී. ගිණුම්කරණ අංශයේ පවතින සේවක ඌණතාවය සමඟ ගිණුම්පොත් තැබීම පොත් තුළ සටහන් කරන අතර තුර පරිසනක ගත ගිණුම් පද්ධතිය යන ක්‍රම දෙකටම පවත්වාගෙන යාමට සිදුවූ බැවින් ගිණුම්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරගෙන යාම අසීරු කාර්යක් වූ අතර එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මදක් ප්‍රමාද වූ අතර රටේ උද්ගතවූ COVID 19 වසංගත තත්වය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා කළමනාකරණ මණ්ඩල

3 | Page

# 2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර

අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ගිණුම්වාර්තා විගණකාධිපතිතුමා වෙත ලබා දීමට සිදු වූයේ සැප්තැම්බර් මස 08 වන දිනය.

(ii) අතිකාල වියදම පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

(iii) වසර 5ක කාලසීමාවක් සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙණි. ඉදිරි කාලසීමාව තුළ රටෙහි සුනිත්‍ය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය අයෝජන සම්බන්ධයෙන් ගැඹුරින් අවධානය යොමුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පෙන්වා දෙන ලද අතර, ඒ අනුව සුනිත්‍ය බලශක්ති සංවර්ධනය සම්බන්ධ ගෝලීය නැඹුරුතා විශ්ලේෂණ කර, ආයෝජන අවස්ථා හඳුනාගෙන වඩාත් විස්තීර්ණ ලෙස, මේ වන විට සකස් කර ඇති සංයුක්ත සැළැස්ම වැඩිදියුණු කිරීම සඳහා උපදේශන සේවා ලබාගැනීමට කටයුතු කර ඇත.

(ඊ) 'ස්විට් ඒෂියා' වැඩසටහන සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර, එය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

(උ) මේ සඳහා කැබිනට් අනුමැතියට යොමු කිරීමෙන් පසු 2019.10.29 දින අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ විමසා ඇත. එම නිර්දේශයන් ලබාදීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙතින් 2020.06.18 දින අප වෙත යොමු කළ ලිපිය අනුව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මඟින් 2020.08.24 දින අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව ඉංජිනේරු තනතුරු පිළිබඳ විස්තර 2020.10.21 දිනැති ලිපිය මඟින් අප අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

## 3.0 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) අදාල පළාත් අධ්‍යාපන කාර්යාල වෙත මේ සම්බන්ධයෙන් විමසීම් සිදුකර ලිපි යොමු කර ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට පිටපතක් යොමු කරමින් මෙම අත්තිකාරම් මුදල් ඉක්මනින් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

4 | Page

# 2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර

(ආ) මෙම මුදල් අයකර ගැනීමට හෝ පොත් සටහන් වලින් ඉවත් කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා කටයුතු යොදා ඇත.

(ඇ) මෙම මුදල් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත.

(ඇ) 2019 වර්ෂය ආරම්භයේදී ප්‍රතිපාදන ලබා ගනිමින් දියත් කිරීමට බලාපොරොත්තු වූ ව්‍යාපෘති කිහිපයකි. ඒ අතර

වායු සමීකරණ සඳහා ප්‍රමිතීන් හා නිගමනයන් හඳුන්වාදීම සඳහා වායුසමීකරණ පරීක්ෂණාගාරයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 135ක මුදලක් හා සූර්ය බලශක්ති පැනල පරීක්ෂණාගාරයක් සඳහා රුපියල් මිලියන 70ක වියදමින් හා ජෛව ස්කන්ධ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන120ක වියදමක් කිරීමට අයවැය ගත කොට තිබුණි.

නමුත්,2019 වර්ෂයේ අප්‍රේල් මස ඇති වූ පාස්කු ප්‍රහාරය හේතු කොට ගෙන සැපයුම්කරුවන් ලංකාවේ ව්‍යාපෘති කටයුතු කිරීමට උනන්දු නොවූ බැවින් හා ජෛව ස්කන්ධ ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කල යුතු ක්‍රමවේදය (ශ්‍රී ලංකාවේ මූල්‍ය රෙගුලාසි ප්‍රකාරවද හෝ UNDP අ යතනයේ ක්‍රමවේදයන් අනුවද) ගැටලු සහගත තත්වයක් උද්ගතවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ කරා ලගාවීමට නොහැකි විය.

(ඉ) මෙම ව්‍යාපෘතිය 2019 වසර අග ආරම්භ කලද 2020 වර්ෂය බාලාපොරොත්තු වූ තරම් ප්‍රගතියක් අත්කරගැනීමට පවතින තත්වය මත නොහැකි විය.තවද භාණ්ඩ ලිපි මගින් BMICH ආයතනයට ලබාදී අවශ්‍ය ඉංජිනේරුවන්ට පුහුණුවද ලබාදී අවශ්‍ය මගපෙන්වීම කර ඇත.

(ඊ) RCL (Regional Center for Lightening) මධ්‍යස්ථානයේ හිඟ බදු මුදල ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වියදමක් ලෙස හඳුනා ගැනීමට අවසර ඉල්ලා ලිපියක් අමාත්‍යාංශයට හා භාණ්ඩාගාරයට යොමු කර ඇත.

(උ) අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත්කල කමිටුවට මෙහි එක් කර්තව්‍යයක් ලෙස ඉහත දෝෂ පිළිබඳව අධ්‍යනය කොට එය වාර්තාවට ඇතුලත් කරන ලෙස දැන්වූ අතර එම සම්පාදිත වාර්තාව සඳහා 2020.09.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

(ඌ) රජයේ ප්‍රතිපත්තිය අනුව ඉදිකිරීම් ආරම්භ කිරීම ආරම්භ කිරීමට අපහසු තත්වයක් ඇතිවී ඇත.

5 | Page

# 2019 විගණකාධිපති වාර්තාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රතිචාර

(එ) මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා, ගිවිසුමේ අඩංගු ප්‍රතිපාදන අනුව බේරුම්කරණ ක්‍රියාවලියකට යොමු වීමට අධිකාරිය විසින් කටයුතු සිදු කරන ලදී. මේ අනුව ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ අංක SLNAC / 125 – 06 – 2019 ලෙස විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න මහතා බේරුම්කරු ලෙස පත්කර මෙම ව්‍යාපෘතිය පිලිබඳ අවසන් තීරණ ගැනීමට අධිකාරිය 2019-06-12 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමැතිය ලබා දී ඇත. බේරුම්කරණ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටලුව සමථයකට පත්කිරීම පිලිබඳ එම ගිවිසුම් ගත පාර්ශවයෙන් යෝජනා කැඳවනු ලැබ එම යෝජනා 21-05-2020 දින කළමාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුණි. එම යෝජනාවලිය වඩාත් විස්තරාත්මක වාර්තාවක් ලෙස නයමිත කාලරාමුව සහිතව ඉදිරිපත් කරන ලෙස කළමාකරණ මණ්ඩලය විසින් දන්වනු ලැබ ඒ කරුණ අදාල පාර්ශවය වෙත දැනුම් දී ඇත. විස්තරාත්මක වාර්තාව ලබා ගැනීමට සිහි කැඳවීමක් ද යවා ඇති අතර එය ලැබුණු පසු කළමාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා මෙම ගැටළුව සමථයකට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

(ඒ) " ස්විච්- ඒෂියා" වැඩ සටහන යටතේ ලැබුණු මුදල් වලින් කොටසක් සේවකයන් අතර බෙදා දීම සම්බන්ධයෙන් විගණන විමසුමක් COPE කමිටුව ඉදිරියෙහි පවතින බැවින් එම මුදල් එම ගිණුමේ එසේම තැබීමට කටයුතු කර ඇත. නමුත් විගණකාධිපතිතුමාගේ උපදෙස් පරිදි භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන ආයෝජනය කිරීමට බලාපොරොත්තු වෙමු.

(ඔ) මෙම මුදල් වෙන්කරනු ලැබුවද අදාල වර්ෂය තුල එම මුදල් වියදම් කිරීමට නොහැකි වුවද ,මෙම ව්‍යාපෘතිය මේ වන විට නිම කර ඇත.

(ඕ) පරිසනක ගිණුම්කරණ පද්ධතිය භාවිතා කිරීම ආරම්භ කිරීම 2019 වර්ෂයේදී සිදු වූ බැවින් පාලන ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම එම වර්ෂයේ දී අපහසු වූ අතර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

6 | Page

# ආයතනික තොරතුරු

**අධිකාරියේ නම**
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**නෛතික තත්ත්වය**
අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත අධිකාරියකි.

**ලියාපදිංචි කාර්යාලය**
05 ගොඩනැගිල්ල, පළමු මහල, බී.එම්.අයි.සී.එච්, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

| | | |
|---|---|---|
| දුරකතන | : | 0112677445 |
| ෆැක්ස් | : | 0112682534 |
| විද්‍යුත් තැපෑල | : | info@energy.gov.lk |
| වෙබ් අඩවිය | : | www.energy.gov.lk |